කඳුරට නව ගම්මාන,යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு

Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

# 2018

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report



















# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2018

කඳුරට නව ගම්මාන,යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு
Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

**කාර්යසාධන වාර්තාව 2018**
**செயலாற்றுகை அறிக்கை 2018**
**Performance Report 2018**

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு
Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

P. Box 562, No. 45, St. Michael's Road, Colombo 03.
Telephone: 0112541369  Fax 0112 328 117
Email : secretary@mhnv.gov.lk / mhplanning2016@gmail.com
Web site : www.mhnv.gov.lk

# කාර්යසාධන වාර්තාව

# 2018



කඳුරට නව ගම්මාන,යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு
Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

# දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රජාව,
අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්,
ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි
ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීම

# මෙහෙවර

වැවිලි අංශයේ ජනතාවගේ
සුභසාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා
සමාජ ආර්ථික පහසුකම් වැඩි දියුණු කිරීම තුළින්
ප්‍රවර්ධනය කිරීම





කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍ය

## ගරු පලනි තිගාම්බරම් මැතිතුමාගේ පණිවුඩය...

ආයතනික හා සමාජ සංවර්ධනය අතින් සැලකීමේදී 2018 වසර කැපී පෙනෙන වසරක් ලෙසට සැලකිය හැකි වන්නේ 2018 අංක 32 දරන පනත සම්මත කරගනිමින් වැවිලි කලාපය සඳහා වූ නවගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටුවීමට අප සමත්වීම හේතුවෙනි. මෙම අධිකාරිය පිහිටුවීම හරහා මෙම අමාත්‍යාංශයේ පරිපාලන ධාරිතාව වඩාත් පුළුල් වන අතර එය ලයින් කාමර වෙනුවට නව නිවාස ලබා දෙමින් වැවිලි ප්‍රජාව අභිමානවත් හා ශක්තිමක් ප්‍රජාවක් බවට පත්කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

දේශීය අරමුදල් හා ඉන්දියානු ආධාර මත නව නිවාස ලබාදීමේ වැඩපිළිවෙළ මෙම වසරේදීත් ක්‍රියාවට නංවන ලදී. පසුගිය වසර 3 තුළදී අදාළ විවිධ දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි වැවිලි මානව සංවර්ධන භාරය හරහා නිවාස ඒකක 4,000 කට අධික ප්‍රමාණයක් ඉදිකර ඇත. 2017 වසරේදී ඉන්දීය රජය එකඟ වූ පරිදි නව නිවාස 10,000 ක් ඉදිකිරීම සඳහා මෙම වසරේදී ගිවිසුම් අත්සන් කරන ලද අතර එය මේ වසරේ ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස ද සැලකිය හැක. එය තවදුරටත් පුළුල් කරමින් ඉන්දියානු රජයේ ආධාර යටතේ තවත් නිවාස ඒකක 4,000 ක් ඉදිවෙමින් පවතින අතර එය අදියර දෙකකින් ක්‍රියාත්මක වේ. එහි පළමු අදියර යටතේ නිවාස ඒකක 1,113 ක ඉදිකිරීම් සිදු වෙමින් පවතින අතර දෙවන අදියර යටතේ නිවාස 2,887 ක ඉදිකිරීම් ද අරඹා ඇත. යෝජිත නිවාස 10,000 ඉදිකිරීම සඳහා මූලික කටයුතු ද දැනටමත් ආරම්භ කර ඇත.

නව නිවාසලාභීන් සඳහා නිරවුල් ඉඩම් ඔප්පු ප්‍රදානය කරමින් ඉඩම් අයිතිය හිමිකර දීමට හැකිවීම ද මෙම වසරේ අත්පත් කරගත් විශේෂ ප්‍රගතියකි. ප්‍රතිලාභීන් 808 ක් සඳහා නිරවුල් ඉඩම් ඔප්පු ලබාදීම මේ වසරේදී සිදුවිය. ඔප්පු ලබාදීම සම්බන්ධයෙන් ආරම්භයේ පැනනැගී තිබූ ගැටලු මගහරවා ඔප්පු ලබාදීම වඩාත් ක්‍රමවත් කිරීමට මේ වන විට හැකියාව ලැබී ඇත.

මීට අමතරව වතු ප්‍රවේශ මාර්ග, රෝහල් මාර්ග, ජල පහසුකම් ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ද පියවර ගන්නා ලද අතර ලයින් කාමර වහල නැවත සෙවිළි කිරීම හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට ද ප්‍රමුඛතාවක් ලබා දී ඇත. එසේම ලෝක බැංකු ආධාර යටතේ වතු ප්‍රදේශයන්හි ළමා සංවර්ධන මධ්‍යස්ථාන 17 ක් අලුතින් ඉදිකිරීමටත් තවත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන 35 ක් වැඩිදියුණු කිරීමටත් පියවර ගෙන ඇත.

සෞඛ්‍යය හා පෝෂණය, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම, පරිසර හා ජල මූලාශ්‍ර සංරක්ෂණය ඉලක්ක කර ගනිමින් ප්‍රජා සංවර්ධනය සඳහා වන දැනුවත් කිරීම් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලද අතර ආදායම් ඉපැයීම් ඉහළ නැංවීම හා දිළිඳුකම දුරලීම ඉලක්ක කර ගනිමින් ගෙවතු වගාව හා මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් ද සිදුකර ඇත.

2018 ඔක්තෝබර් 26 දින සිදුවූ දේශපාලන පරිවර්තනයත් සමග ඉහත ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සියල්ල පසුබෑමකට ලක්වූ අතර එවන් අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ නොදුන්නේ නම් මෙම අත්පත් කරගත් ප්‍රගතිය වඩාත් ඉහළ මට්ටමකට පත්වනු ඇත. කෙසේ නමුත්, අධිකාරිය හරහා සිදුවන පරිපාලන ධාරිතාව පුළුල්වීම හා එහි සක්‍රිය ක්‍රියාකාරිත්වය තුළින් වැවිලි ප්‍රජාව අන් ප්‍රජාවන් හා සම තත්ත්වයකට පත්කිරීම උදෙසා වන අමාත්‍යාංශ දැක්ම යථාර්ථයක් වනු ඇත.

පලනි තිගාම්බරම් (පා.ම.)
කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍ය



කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## ලේකම්තුමාගේ පණිවුඩය...

සියලු ශ්‍රී ලාංකිකයින්ට ප්‍රතිලාභ හිමිවන සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩනැංවීම සඳහා වන " V 2025 පොහොසත් රටක් " රජයේ ආර්ථික දැක්ම යථාර්ථයක් වනු පිණිස, දරිද්‍රතාවයේ ඉහළම අගයක් පෙන්නුම් කරන වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සහතික කිරීමට අවැසි ක්‍රියාමාර්ග ගැනීම උදෙසා පසුගිය වසර කිහිපය මුළුල්ලේ සිටම මෙම අමාත්‍යාංශය කැපවීමෙන් ක්‍රියාකර ඇත.

ඉතා අවම පහසුකම් අත්විඳිමින් පේලි නිවාස සිය වාසස්ථාන කොටගත් වැවිලි ප්‍රජාව සඳහා, "නව ගම්මාන සංකල්පය" හඳුන්වා දෙමින් ඒ යටතේ සියලු මූලික පහසුකම් සහිත නිවසක් හා පර්චස් 07 ක නිරවුල් ඉඩම් අයිතිය හිමිකර දී වඩාත් අභිමානවත් ගෞරවනීය ප්‍රජාවක් ලෙස නැගී සිටීමේ අවස්ථාව ඔවුන් වෙත උදාකර දීමට හැකිවීම මෙම අමාත්‍යාංශය ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සනිටුහන් කිරීමට කැමැත්තෙමි.

අධ්‍යාපනය, සෞඛ්‍යය, පානීය ජලය, සෞඛ්‍යය පහසුකම්, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම වැවිලි ප්‍රජාව තුල පවත්නා දරිද්‍රතාව අවම කිරීමටත්, ඔවුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යාංශය ක්‍රියාකර ඇති අතර ඉදිරියේදී එය වඩාත් පුළුල් කිරීම සඳහා ද කටයුතු කරමින් සිටී.

ජනාධිපති ලේකම් කාර්යාලයේ මග පෙන්වීම යටතේ, ජාතික පෝෂණ ලේකම් කාර්යාලය විසින් සකස් කරන ලද පෝෂණය සඳහා වන බහු ආංශික සැලැස්ම ක්‍රියාවට නංවමින් වැවිලි ප්‍රදේශයන්හි ළමා මන්දපෝෂණය තුරන් කිරීම උදෙසා "ටිකිරි ශක්ති" පෝෂණ අතිරේකය වැවිලි ප්‍රදේශයන්හි 40,000 ට අධික දරුවන් වෙත ලබා දීමට හැකිවීම මෙම අමාත්‍යාංශය ලද තවත් සුවිශේෂී ජයග්‍රහණයක් ලෙසට හැඳින්විය හැක.

අතිගරු ජනාධිපතිතුමා විසින් ග්‍රාමීය ප්‍රජාවගේ දිළිඳුකම දුරලීම සඳහා හඳුන්වා දුන් "ග්‍රාම ශක්ති" ව්‍යාපාරයට සමගාමීව යමින්, නව වැවිලි ගම්මානයන්හි නිවාස ප්‍රතිලාභී පවුල් කේන්ද්‍ර කර ගනිමින් ඔවුන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය විසින් විශේෂ වැඩපිළිවෙළක් දියත් කර ඇති අතර එමගින් වැවිලි ගම්මාන ආශ්‍රිතව අපනයනය ඉලක්ක කරගත් සමෝධාන කාබනික ගොවිපලවල් ඇති කිරීමටත්, ඔවුන් සඳහා වන ස්වයං රැකියා අවස්ථාවන් පුළුල් කිරීමටත් කටයුතු යොදා ඇති අතර වැවිලි ප්‍රජාව, වැවිලි ක්ෂේත්‍රයේ රැකියාවලින් ඉවත්වීමෙන් වර්තමානයේ වැවිලි ක්ෂේත්‍රය මුහුණ පා ඇති ශ්‍රමික ගැටළුව අවම කිරීමටත්, එම ප්‍රදේශයන්හි පවතින විරැකියාව අවම කිරීමටත්, වැවිලි ප්‍රජාව වෙත වඩාත් යහපත් ජීවන තත්ත්වයක් හිමිකර දීමටත් අවස්ථාවක් මේ තුලින් උදාවනු ඇත.

ඉංජිනේරු (ආචාර්ය) පී. සුරේෂ්
ලේකම්
කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

# පටුන


1. හැඳින්වීම

2. අමාත්‍යාංශය ස්ථාපිත කිරීම

3. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා තත්‍ය කාර්ය මණ්ඩලය

4. අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රවේශය හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

   4.1. සංවර්ධන ප්‍රවේශය

   4.2. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ආයතනික ව්‍යුහය

5. 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය

6. සංවර්ධන වැඩසටහන් හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය

   6.1. කඳුරට නව ගම්මාන සඳහා නිවාස

   6.2. පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය

   6.3. ජීවනෝපාය සංවර්ධනය

7. තිරසර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම

8. අමාත්‍යාංශය විසින් 2018 වසරේ අත්පත් කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණ

9. අමාත්‍යාංශ විෂයය පථය යටතට අයත් ආයතන

   9.1. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

   9.2. වැවිලි මානව සංවර්ධන භාරය

   9.3. ප්‍රජාශක්ති මෙහෙයුම් ඒකකය

10. ඇමුණුම්

11. අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ ඡායාරූප

# 1.හැඳින්වීම

ශතවර්ෂ දෙකකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනු ලබන ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවගේ මූලාරම්භය, මෙරට බ්‍රිතාන්‍යයේ යටත් විජිත යුගයක්ව පැවති සමය දක්වා පැතිර යයි. බ්‍රිතාන්‍යයන් විසින් වර්ෂ 1840 දී කඳුකරයේ කෝපි වගා කිරීම සඳහා කම්කරුවන් ලෙස දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ මෙම ජන කොට්ඨාසය, කෝපි වගාව විනාශවීමෙන් අනතුරුව ඇතිකළ තේ හා රබර් වගාවන් කේන්ද්‍ර කර ගනිමින් සුවිශේෂී හුදකලා ජන කොටසක් ලෙස වර්ධනය වී ඇත.

ලැයින් කාමර හෙවත් පේලි නිවාස සිය වාසස්ථාන කොට ගනිමින්, ඉතා දිලිඳු කම්කරු ජීවන රටාවකට හිමිකම් කියන මොවුන්, මානව සංවර්ධන දර්ශක (නාගරික හා ග්‍රාමීය) හා සැසඳීමේදී, අන් ජන කොටස් වලට සාපේක්ෂව කැපී පෙනෙන සමාජ විෂමතාවකට ලක්ව ඇති බව පෙනී යයි. සමාජ සංවර්ධන දර්ශක හා සසඳා බැලීමේදී, ඔවුන්ගේ දර්ශකයන් ජාතික මට්ටමේ සමාජ සංවර්ධන දර්ශකයනට වඩා පහළ අගයක් ගනී.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 5% ක් පමණ, වතු ප්‍රජාව නියෝජනය කරනු ලබයි. වැවිලි අංශය ආශ්‍රිතව මිලියන 1.1 පමණවන ජනගහනයක් ඍජුව හා වක්‍රව එම ක්ෂේත්‍රයේ නියැළී සිටින්නේ තමන් සතුව එක් බිම් අඟලක හෝ නීත්‍යානුකූල අයිතියක් නොමැතිවය.

## 1.1. වතු ක්ෂේත්‍රය පිළිබඳ මූලික දත්ත (කුඩා තේ වතු හැර)

### 1.1.1. ඉඩම් පිළිබඳ විස්තර

- වතු සමාගම් සංඛ්‍යාව - 23
- වතු සංඛ්‍යාව- 453
- මුළු ඉඩම් ප්‍රමාණය - හෙක්ටයාර් 280,034
    - තේ හෙක්ටයාර් 80,637
    - රබර් හෙක්ටයාර් 45,881
    - පොල් හෙක්ටයාර් 9,482
    - වගා නොකරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 117,275

(මූලාශ්‍රය:- Annual Health Return, වැවිලි මානව සංවර්ධන භාරය (වැ.මා.සං.භා., 2014)

### 1.1.2. වතු ජනගහන තොරතුරු

- මුළු ජනගහනය :943,390

| දිස්ත්‍රික්කය | නුවරඑළිය | බදුල්ල | මහනුවර | රත්නපුර | ගාල්ල | කෑගල්ල |
|---|---|---|---|---|---|---|
| ජනගහනය | 408,052 | 164,735 | 91,310 | 106,531 | 19,895 | 60,112 |

| දිස්ත්‍රික්කය | මොණරාගල | මාතලේ | කළුතර | මාතර | එකතුව |
|---|---|---|---|---|---|
| ජනගහනය | 9,084 | 20,449 | 39,455 | 23,767 | 943,390 |

මූලාශ්‍රය :- ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව - 2018

## 1.1.3. නිවාස, ජලය හා සනීපාරක්ෂක පහසුකම්

| නිවාස - වර්තමාන තත්ත්වය | | |
|---|---|---|
| | නිවාස සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සංවර්ධනය කරන ලද නිවාස | **35,027** | **15.8%** |
| | | |
| යුගල නිවාස | 28,062 | |
| තනි ඒකක පේලි නිවාස | 73,539 | |
| ද්විත්ව පේලි නිවාස | 69,613 | |
| තාවකාලික නිවාස | 13,814 | |
| මහල් පේලි නිවාස | 1,270 | |
| **නිවාස අවශ්‍යතාවය** | **186,298** | **84.2%** |
| **මුළු නිවාස** | **221,325** | **100 %** |

| ජල පහසුකම් - වර්තමාන තත්ත්වය | | |
|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු පවුල් සංඛ්‍යාව | 256,545 | |
| | | |
| දැනට පහසුකම් ලබන පවුල් සංඛ්‍යාව | 142,765 | 55.6% |
| ජල පහසුකම් අවශ්‍ය පවුල් සංඛ්‍යාව | 113,780 | 44.4% |

| සනීපාරක්ෂක පහසුකම් - වර්තමාන තත්ත්වය | | |
|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු පවුල් සංඛ්‍යාව | 256,545 | |
| | | |
| දැනට පහසුකම් ලබන පවුල් සංඛ්‍යාව | 138,257 | 53.9 % |
| වැසිකිළි අවශ්‍යතාව පවුල් සංඛ්‍යාව | 118,288 | 46.1 % |

මූලාශ්‍රය :- Annual Health Return, වැ.මා.සං.හා., 2016

## 1.1.4 සෞඛ්‍ය හා පෝෂණය

**( ග්‍රාමීය, නාගරික හා ජාතික මට්ටම්වලට සාපේක්ෂව, වතු අංශයේ වයස අවු: 5 ට අඩු ළමයින්ගේ පෝෂණ තත්ත්වය)**

| ජනගහන සෞඛ්‍ය සමීක්ෂණය - 2016 / 2017 | | | | |
|---|---|---|---|---|
| දර්ශක | අංශය | | | ජාතික % |
| | වතු % | ග්‍රාමීය % | නාගරික % | |
| අවුරුදු 5 ට අඩු ළමයි | | | | |
| මිටිබව (වයසට සරිලන උස) | 31.7 | 17.0 | 14.7 | 17.3 |
| අඩු බර (වයසට සරිලන බර) | 29.7 | 20.8 | 16.4 | 20.5 |
| කෘෂබව (උසට සරිලන බර ) | 13.4 | 15.6 | 12.9 | 15.1 |

මූලාශ්‍රය :- ජනගහන සෞඛ්‍ය සමීක්ෂණ වාර්තාව 2016/2017.

# 2. අමාත්‍යාංශය ස්ථාපිත කිරීම

## 2.1. පසුබිම

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශයේ 25 වෙනි වගන්තිය, සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 17, 23 හා 24 වගන්ති මෙන්ම ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 11 (1) වගන්තියට අනුව ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය සේවා හා ආරක්ෂාවද, අවශ්‍ය සමාජසේවා ආරක්ෂාවද ඇතිව, තමන්ගේත් තම පවුලේත් සෞඛ්‍යයට හා යහපතට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් භුක්ති විඳීමටත්, තම පාලනයෙන් බැහැර ආපදා හේතුවෙන්, ජීවිකාව දුෂ්කර වූ විට රැකවරණය ලැබීමටත්, පූර්ණ මනුෂ්‍යයෙකු බිහිවීම සඳහා අවශ්‍ය පෞද්ගලිකත්වය හා පෞද්ගලික අවකාශය භුක්ති විඳීමටත්, සෑම මනුෂ්‍යයෙකුටම හිමිකමක් හා අයිතියක් ඇත.

ශ්‍රී ලංකාවද සිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10,11,13 හා 14 වගන්ති මගින්, මෙම අයිතිවාසිකම් තහවුරු කරමින් සියළු ජන කොටස් වෙත මෙකී සියළුම මූලික සේවාවන් සහ පහසුකම් භුක්ති විඳීමේ අයිතිය තහවුරු කරලීමේ භාරදූර වගකීම දශක ගණනාවක් තිස්සේ ක්‍රියාවට නංවමින් සිටී.

දකුණු ඉන්දියාවෙන් සංක්‍රමණිකයන් ලෙස පැමිණ මධ්‍යම, ඌව, සබරගමුව සහ දකුණු පළාත් හි ප්‍රදේශවලට සීමාවෙමින්, හුදකලාව ඔවුන්ටම ආවේනික සමාජ, ආර්ථික සහ සංස්කෘතික කොටසක් ලෙස විකාශය වූ වැවිලි ප්‍රජාව, බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ පටන්ම සිය මූලික අවශ්‍යතාවයන් උදෙසා වතු කළමණාකාරීත්වය මත යැපීම හේතුවෙන් රජය මගින් ඔවුන් වෙත සපයනු ලබන මූලික සේවාවන් භුක්ති විඳීමේ අවස්ථාව හිමිවූයේ ඉතා අල්ප මට්ටමකිනි.

එහි ප්‍රතිඵලය වී ඇත්තේ ශත වර්ෂ දෙකකට ආසන්න කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට සුවිශාල දායකත්වයක් සපයනු ලැබූ මෙම ශ්‍රමික ප්‍රජාවට මෙම වරප්‍රසාද ලඟාවීම ප්‍රමාද වීමයි. එබැවින්, රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයන්හි පවතින නීති රාමූන්හි ඇති ඇතැම් නොගැලපීම් හේතුවෙන්, පෞද්ගලික වතු සමාගම් යටතේ ජීවිකාවේ නියැලී සිටින මිලියනයකට ආසන්න ජන කොටස් වෙත නිසි සේවාවන් සැපයීමේ ඇති දුෂ්කරතා මගහැර, මෙම ප්‍රජාවගේ සමාජ සංවර්ධනය ප්‍රශස්ථ මට්ටමකට නැංවීම සඳහා සුවිශේෂිත වූ යාන්ත්‍රණයක් ඇති කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතුවිය.

## 2.2. අමාත්‍යාංශය ස්ථාපිත කිරීම

ඒ අනුව, වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවන් තුරන්කොට අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්, ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීමේ අදිටනින්, නව ප්‍රවේශයකින්, නව රජයේ ආරම්භයත් සමඟ 2015.09.25 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී.

## 2.3. ප්‍රධාන කාර්යභාරය

- රජයේ හා පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි පේළි නිවාසවල ජීවත්වන ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා නව ගම්මාන / නගර නිර්මාණය කිරීම.
- වතු අංශයේ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ජීවනෝපාය උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- වැවිලි ප්‍රජාව ආර්ථිකව, සාමාජීයව හා සංස්කෘතිකමය වශයෙන් නගාසිටුවීම සඳහා මූලික පහසුකම් ඇතුළු අනෙකුත්අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පියවර ගැනීම.
- ග්‍රාමීය වතු අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## 2.4. කාර්ය භාරය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

- වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය
- වැවිලි මානව සංවර්ධන භාරය
- පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හැටන්
- සංස්කෘතික මධ්‍යස්ථානය - රම්බොඩ
- නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය
- ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය (E- KIOSK Centers)

# 3. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා තත්‍ය කාර්ය මණ්ඩලය

## 3.1. 2018.12.31 දිනට අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය

| අනු අං ක | තනතුර | සේවය | ශ්‍රේණිය/ පංතිය | අනුමත කාර්ය | | තත්‍ය කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | අනියම් / කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් / කොන්ත්‍රාත් |
| 1. | ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | විශේෂ | 1 | - | 1 | - |
| 2. | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | විශේෂ | 2 | - | 2 | - |
| 3. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 4. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 5. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 6. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | I පන්තිය | 1 | - | - | - |
| 7. | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 8. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 9. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | II /III පන්තිය | 1 | - | - | - |
| 10. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | II /III පන්තිය | 3 | - | 1 | - |
| 11. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේවය | II /III පන්තිය | 2 | - | 2 | - |
| 12. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | II /III පන්තිය | 2 | - | 1 | - |
| 13. | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | II /III පන්තිය | 2 | - | - | - |
| 14. | නීති නිලධාරී | | II /III පන්තිය | 1 | - | - | - |
| 15. | පරිපාලන නිලධාරී | රා.කළ.සහ.සේවය | අධි ශ්‍රේණිය | 1 | - | - | 1 |
| 16. | තොරතුරු හාසන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී.ලං.තො.හා.සං. | II/I | 1 | - | - | - |
| 17. | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | I / IIපන්තිය | 2 | - | - | - |
| 18. | සංඛ්‍යා ලේඛන නිලධාරී | | | 1 | - | 1 | - |
| 19. | සංවර්ධනනිලධාරී | ශ්‍රී.ලං.සං.නිල.සේ | I/II/III පන්තිය | 19 | - | 12 | - |
| 20. | තාක්ෂණිකනිලධාරී | ශ්‍රී.ලං.තා.සේ | I/II/III පන්තිය | 8 | - | - | 4 |
| 21. | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | | - | 1 | - | 1 |
| 22. | තොරතුරු හාසන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො.හා.සං. | 3- III/II/I | 2 | - | - | - |
| 23. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සහ.සේවය | I/II/III පන්තිය | 25 | - | 19 | - |
| 24. | වැව්ලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | අමාත්‍යාංශගත | | 225 | - | 150 | - |
| 25. | නිශ්චල ඡායාරූප ශිල්පි | තාවකාලික | | - | 1 | - | 1 |
| 26. | වීඩියෝ කැමරා ශිල්පි | තාවකාලික | | - | 1 | - | 1 |
| 27. | කැමරා පුද්ගලික සහායක | තාවකාලික | | - | 1 | - | 1 |
| 28. | රියදුරු | ඒකාබද්ධරියදුරු සේවය | I/II/III විශේෂ | 17 | - | 9 | - |
| 29. | කාර්යාලකාර්ය සහායක | කා.සේවක සේවය | I/II/III විශේෂ | 16 | - | 12 | - |
| 30. | ප්‍රජා ශක්ති මෙහෙයුම් ඒකකයේ කාර්ය මණ්ඩලය | | | | | | |
| | එකතුව | | | **337** | **4** | **215** | **09** |

## 3.2

### කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය (2018.12.31 දිනට)



## 3.3 2018.12.31 දිනට අමාත්‍ය කාර්යාලයේ කාර්යමණ්ඩල විස්තර

| අනු. අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | එම්. වාමදේවන් මයා | ගරු අමාත්‍යතුමාගේ උපදේශක |
| 2. | ප්‍රශාන්ත් මහේන්ද්‍ර රාජා මයා | පෞද්ගලික ලේකම් |
| 3. | ගනපති නගුලේශ්වරන් මයා | සම්බන්ධීකරණ ලේකම් |
| 4. | රෝහණ විතානගේ මයා | සම්බන්ධීකරණ ලේකම් |
| 5. | අරුණ රත්නායක මයා | මාධ්‍ය ලේකම් |
| 6. | පලනි විජයකුමාර් මයා | මහජන සම්බන්ධතා නිලධාරි |
| 7. | එස්.කමලදාසන් මයා | පුද්ගලික සහකරු |
| 8. | වී.ජේ.එස්. ඇන්තික් මයා | කළමනාකරණ සහකාර |
| 9. | ජේ.ඒ.එන්.පී.ජයසුන්දර මෙය | කළමනාකරණ සහකාර |
| 10. | විශ්වනාදන් ප්‍රවීනා මෙය | කළමනාකරණ සහකාර |
| 11. | ලංකා ජීවනී අලූත්ගේ මිය | කළමනාකරණ සහකාර |
| 12. | සෙබස්තියන් ඇන්තන්රාජ් මයා | කළමනාකරණ සහකාර |
| 13. | ඩී. එම්. එම්. දිසානායක මයා | වීඩියෝ කැමරා ශිල්පි |
| 14. | පලනි තංගවේලුමයා | කැමරා සහකාර |
| 15. | සී. තිබන් ප්‍රශාන්ත් මයා | ඡායාරූ ශිල්පී |
| 16. | ඒ. ශන්මුගනා මයා | රියදුරු |
| 17. | ආර්. විශ්වලිංගම් මයා | රියදුරු |
| 18. | ඩී. රජිනිකාන්ත් මයා | රියදුරු |
| 19. | එස්. පුලේන්ද්‍රකුමාර් මයා | රියදුරු |
| 20. | ජී.සදීසන් මයා | රියදුරු |
| 21. | ඩී.එම්. සමන් ප්‍රදීප් මයා | රියදුරු |
| 22. | පරමගුරු සිවකුමාර් මයා | රියදුරු |
| 23. | ජේසුදාසන් වනදාස් මයා | රියදුරු |
| 24. | කේ.වෙන්ගටේශ්වරන් මයා | රියදුරු |
| 25. | එස්. ලිනෝත් ප්‍රසාද් මයා | කාර්යාල කාර්ය සහායක |
| 26. | විනයාගමූර්ති දිනේෂ් කුමාර් මයා | කාර්යාල කාර්ය සහායක |

# 3.4 අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි කාර්යයන් හා වගකීම්

## 3.4.1 ලේකම් අංශය

අමාත්‍යාංශයේ ප්‍රධානියා මෙන්ම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ද වශයෙන් කටයුතු කරන අමාත්‍යාංශ ලේකම් යටතේ ලේකම් අංශය ක්‍රියාත්මක වන අතර, එම අංශය වෙත පැවරී ඇති විශේෂ කටයුතු ක්‍රියාත්මක කිරීමත්, අමාත්‍යාංශයේ අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීමත්, රැස්වීම් සංවිධානය, වෙනත් අමාත්‍යාංශ හා විදේශීය ආයතන ආදිය සම්බන්ධීකරණයත් මෙම අංශය මගින් මූලික වශයෙන් සිදු කරනු ලබයි.

### 3.4.1.1 2018.12.31 දිනට ලේකම් අංශයේ කාර්ය මණ්ඩල විස්තර

| අනු. අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | සී.අයි.ඒ. විජේනායක මයා | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් |
| 2 | ජේ.ප්‍රදීප් මයා | කාර්යාල කාර්ය සහායක |
| 3 | එච්.ජී.කේ. සිසිර කුමාර | කාර්යාල කාර්ය සහායක |

## 3.4.2 පාලන අංශය

වැව්ලි ප්‍රජාව සඳහා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන ව්‍යාපෘති ඉලක්ක ගත වකවානු වලට අවසන් කිරීම සඳහා අවශ්‍ය අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය සැකසීම, නව තනතුරු ඇති කිරීම, නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු කිරීම ඇතුළු අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය හා මෙහෙයවීම පාලන අංශයේ මූලික කාර්යභාරය වේ. එයට අමතරව,

- අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලනය
- නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාල අනෙකුත් ආයතනික කටයුතු සිදු කිරීම
- පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගැනීම
- කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම හා අදාළ ආයතන වෙත බෙදා හැරීම
- නිලධාරීන්ගේ නිවාඩු ආශ්‍රිත ලේඛන, ලිපිගොනු නඩත්තු කිරීම
- නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණු සම්බන්ධව කටයුතු සිදු කිරීම
- වාහන සංචිතය පවත්වාගෙන යාම හා වාහන නඩත්තුව
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතර සම්බන්ධීකරණය, අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය

ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ හා වෙනත් අණපනත් අනුව කාර්ය මණ්ඩලය මෙහෙය වීම යනාදී ක්‍රියාදාමයන් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

### 3.4.2.1 2018.12.31 දිනට පාලන අංශයේ කාර්ය මණ්ඩල විස්තර

| අනු. අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | ඒ.එස්.ද.මෙල් මිය | අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) |
| 2. | වී. අරුල්රාජා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| 3. | ආර්. ආර්. එම්. සරත් චන්ද්‍රසිරි මයා | පරිපාලන නිලධාරී |
| 4. | පී.එච්.එන්.රාජකරුණා මයා | සංවර්ධන නිලධාරී |
| 5. | ඩබ්. ජේ.එම්.ජී.අයි.එම්.ජයසිංහ මිය | සංවර්ධන නිලධාරී |
| 6. | ඩී.පී.එම්.සී.එච්.ධර්මරාජා මෙය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 7. | කේ.ඩී.කේ ගංගා මිය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 8. | කේ.එම්.පී.කේ.කුලසේකර මයා | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 9. | පී.ඩබ්.එස්.අයේෂා මිය | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා |
| 10. | අයි.එන්.ඩී.කුමාරගේ මයා | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා |
| 11. | එල්.අබේගුණසේකර මයා | රියදුරු |
| 12. | එස්.උදයසිරි මයා | රියදුරු |
| 13. | එම්.එස්.පුෂ්ප කුමාර මයා | රියදුරු |
| 14. | එච්.ඒ.එන්.හත්තසිංහ මයා | රියදුරු |
| 15. | එම්.ජයරාම් මයා | රියදුරු |
| 16. | එස්.නිලන්ත කුමාර මයා | රියදුරු |
| 17. | වයි.පී.එස්. සෙනරත් මයා | රියදුරු |
| 18. | කේ. ජී. ප්‍රේමතිලක මයා | රියදුරු |
| 19. | ටී.ජී.එල්.එස්.අබේසේකර මයා | රියදුරු |
| 20. | එන්.බී.ජී.එල්.එල්.කේ.කුමාර මයා | කාර්යාල කාර්ය සහායක |
| 21. | කේ. දුෂාන්තන් මයා | කාර්යාල කාර්ය සහායක |
| 22. | ප්‍රේම් මයා | කාර්යාල කාර්ය සහායක |
| 23. | ආර්.විනෝද් කුමාර් මයා | කාර්යාල කාර්ය සහායක |

## 3.4.3 සංවර්ධන අංශය

වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා අමාත්‍යාංශය, සංරචක 05 ක් යටතේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා ඔස්සේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම හා සම්බන්ධීකරණය පිළිබඳ සියළු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහායයන් යටතේ ලබා දෙන ලද අරමුදල්ද යොදවමින් අමාත්‍යාංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේ කාර්යභාරය සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි. පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළුව, ඉහත කර්තව්‍යයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශයද සංවර්ධන අංශය හා එක්ව ක්‍රියා කරනු ලබයි.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා මෙහෙයවීම හා අදාල ගෙවීම් නිර්දේශ කිරීම, මූල්‍ය හා භෞතික ප්‍රගතිය අදාල අංශ වලට වාර්තා කිරීම.
- ඉංජිනේරු ඇස්තමේන්තු සැකසීම, ව්‍යාපෘති මාර්ගෝපදේශන සැකසීම හා අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- ප්‍රජාශක්ති මධ්‍යස්ථාන, පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය හා නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය පරිපාලනය
- පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම.

### 3.4.3.1 2018.12.31 දිනට සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩල විස්තර

| අනු. අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | ටී.ඩී.එස්.පී.පෙරේරා මයා | අතිරේක ලේකම් (සංවර්ධන) |
| 2. | පී. නාමගල් මිය | අධ්‍යක්ෂ (සංවර්ධන) |
| 3. | කේ.එම්.එච්.බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) |
| 4. | යූ.එල්.ජයසුන්දර මෙය | සහකාර අධ්‍යක්ෂ (නිවාස ) |
| 5. | කේ.ප්‍රදීපා මිය | සහකාර අධ්‍යක්ෂ (යටිතල පහසුකම්) |
| 6. | ඩබ්.සී.කේ.වඩුගේ මිය | සංවර්ධන නිලධාරී |
| 7. | එස්.අරුල්නාදන් මයා | සංවර්ධන නිලධාරී |
| 8. | බී.පී.හිරන්‍යා මිය | සංවර්ධන නිලධාරී |
| 9. | ඩබ්.සී.ජේ.පෙරේරා මිය | සංවර්ධන නිලධාරී |
| 10. | කේ.කුහනිදී මිය | සංවර්ධන නිලධාරී |
| 11. | එම්. එම්. ගුණරත්න මෙය | තාක්ෂණික නිලධාරී |
| 12. | එන්. පී. පී. ටී. විමලදාස මෙය | තාක්ෂණික නිලධාරී |
| 13. | එස්. මනිවන්නන් මයා | තාක්ෂණික නිලධාරී |
| 14. | එස්. දිනේෂ් මයා | තාක්ෂණික නිලධාරී |
| 15. | ඩබ්.ඒ.සී.පෙරේරා මයා | රාජ්‍ය කළමණාකරණ සහකාර |

| | | |
|---|---|---|
| 16. | කේ.නිත්‍යා මෙය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 17. | එම්. එච්. ෆබීනා මෙය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 18. | ජේ.එන්.එස්.ජයසිංහ මෙය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 19. | එම්.එම්.එස්.එම්.සමරනායක මෙය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 20. | ඩබ්.එම්.එස්.සන්ජිවනී මෙය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 21. | ජී. චන්ද්‍රකුමාර මයා | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා |
| 22. | ආර්.එම්.එස්.ලසන්ත මයා | කාර්යාල කාර්යාල සහායක |
| 23. | වී.ඥාණරාජ් මයා | කාර්යාල කාර්යාල සහායක |

## 3.4.3.2 සංවර්ධන අංශයේ අධීක්ෂණය යටතේ 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්, වෙන්කල ප්‍රතිපාදන හා 2018.12.31 දිනට ප්‍රගතිය

| | වැඩසටහන | වෙන්කල ප්‍රතිපාදන ( රු. මි. ) | | 2018.12.31 දිනට ප්‍රගතිය (රු.මි.) | |
|---|---|---|---|---|---|
| | | දේශීය | ඉන්දියානු ආධාර | දේශීය | ඉන්දියානු ආධාර |
| 01 | ජීවනෝපාය සංවර්ධනය | 100 | - | 51.44 | - |
| 02 | පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය | 500 | - | 370.21 | - |
| 03 | වතු නිවාස සංවර්ධනය (කඳුරට නව ගම්මාන සඳහා නිවාස ඉදි කිරීම) | 2,000 | - | 1,175.96 | |
| 04 | ඉන්දියානු රජයේ ආධාර මත හැටන් පුල්බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 15 | 94 | 1.43 | - |
| 05 | ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන | 90 | 587 | 64.29 | 587 |
| | එකතුව | **2,705** | **681** | **1,663.33** | **587** |
| | මුළු එකතුව | **3,386** | | **2,250.33** | |

## 3.4.4 සැළසුම් අංශය

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රධාන වශයෙන් පහත කර්තව්‍යයන් සැළසුම් අංශය මගින් ඉටු කරයි.

- සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී සහාය ලබාදීම හා අමාත්‍යාංශයීය වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සැකසීම
- අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම
- ජාතික ක්‍රියාකාරී සැලස්ම (2016 – 2020) ක්‍රියාවට නැංවීම හා එයට අදාල ආයතන සම්බන්ධීකරණය
- නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති යෝජනා සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම
- ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ඇතුලත් ප්‍රගති වාර්තා සැකසීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම
- වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
- අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම
- මෙතෙක් විශාල අඩුපාඩුවක්ව පැවැති වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා දත්ත සැකසුම් පද්ධතියක් සැකසීම, දත්ත එක්රැස් කිරීම හා යාවත්කාලීන කිරීම

### 3.4.4.1 2018.12.31 දිනට සැළසුම් අංශයේ කාර්ය මණ්ඩල විස්තර

| අනු. අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | කේ.ඩී.අනෝජා මුණසිංහ මෙය | අධ්‍යක්ෂ (සැළසුම්) |
| 02 | ටී.ඩී.බංගමුව මිය | සහකාර අධ්‍යක්ෂ (සැළසුම්) |
| 03 | ජී.එම්.වයි.ඩී.ද. සිල්වා මිය | සංඛ්‍යාලේඛන නිලධාරී |
| 04 | කේ.ඩී.කේ.ද.සිල්වා මිය | සංවර්ධන නිලධාරී |
| 05 | ජේ.ඒ.ඒ.එන්.ජයසූරිය මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 06 | එස්. ප්‍රසාන්ත් මයා | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සළසන්නා |
| 07 | වී. සිවපෙරුමාල් මයා | කාර්යාල කාර්ය සහායක |

## 3.4.5 ගිණුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාල ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මගින් සිදු කරනු ගෙවීම් සම්බන්ධ සියළු කටයුතුවල වගකීම ගිණුම් අංශය මගින් දරනු ලබයි.

### 3.4.5.1 2018.12.31 දිනට ගිණුම් අංශයේ කාර්ය මණ්ඩල විස්තර

| අනු. අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ආර්.එම්.එස්.වසන්තා මිය | ප්‍රධාන ගණකාධිකාරී |
| 02 | එන්.මනෝහරන් මිය | සංවර්ධන නිලධාරී |
| 03 | කේ.ඩී.ඩබ්.එච්.එන්.ඩී.ජී.ආර්.බී.දිවාරත්න මයා | සංවර්ධන නිලධාරී |
| 04 | එච්.ජී.එම්.එල්.නිරෝශිනී මිය | සංවර්ධන නිලධාරී |
| 05 | ඒ.ආර්.රාජේන්ද්‍රම් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 06 | ඩබ්.එම්.ඩබ්.ජී.එන්.ඒ.පේමරත්න මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 07 | එස්.බී.වයි.එම්.එන්.එස්.සිවරත්න මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 08 | එච්.බී.අයි.එස්.වික්‍රමසිංහ මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 09 | ඩී.එන්.එල්.එන්.ධනන්ජිනී මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 10 | කේ.ජීවාගයත්‍රි මෙය | කාර්යාල කාර්ය සහායක |
| 11 | කේ.දිනේෂ් කුමාර් මයා | කාර්යාල කාර්ය සහායක |
| 12 | ඩබ්.එන්.එන්.කේ.සිල්වාමිය | කාර්යාල කාර්ය සහායක |

## 3.4.6 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන්හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ ඇගයීමකට ලක් කිරීමත්, වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රගතිය නිශ්චය කිරීමට සහායවීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාල කරුණු අනාවරණය කිරීමත්,විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමත් අභ්‍යන්තර විගණන අංශය විසින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි.

### 3.4.6.1 2018.12.31 දිනට අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩල විස්තර

| අනු. අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | කේ.ජී.එස්.ඩබ්.වීරක්කොඩි මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 02 | එම්. මනෝජ්කාන්ත් මයා | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා |
| 03 | පී.වනරාජා මිය | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා |
| 04 | එස්.එන්.විජේසූරිය මෙය | කාර්යාල කාර්ය සහයක |

# 4 අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රවේශය හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

## 4.1 සංවර්ධන ප්‍රවේශය

වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවන් තුරන්කොට ඔවුන් අභිමානවත් ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීමේ අරමුණින් ආරම්භ කල මෙම කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි ප්‍රදේශ කේන්ද්‍ර ගත කරගනිමින් ජීවත් වන පවුල් 2,50,000 ක පමණ (මිලියනයකට අධික ජනගහණයක් ඇති) වතු ජනතාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය නිසි දිශානතියක් ඔස්සේ හා මනා අධීක්ෂණයකින් යුතුව සිදු කිරීම සඳහා, පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මක් (2016-2020) සකස් කොට එය ක්‍රියාවට නංවා ඇත.

එමගින් ප්‍රමුඛතාව ලබා දී ඇති නිවාස, පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම්, සෞඛ්‍ය හා පෝෂණය,අධ්‍යාපනය හා මුල් ළමාවිය සංවර්ධනය, වෘත්තීය පුහුණුව හා නිපුණතාවය, ප්‍රජාව සවිබල ගැන්වීම යනාදී ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන අනෙකුත්රේඛීය අමාත්‍යාංශ, පළාත් අමාත්‍යාංශ ඇතුළු සියලුම ආයතනයන්හි පූර්ණ දායකත්වයලබාගනිමින්වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා, පැවරී ඇති සංවර්ධන කාර්යභාරයන් නොපිරිහෙලා ඉටු කිරීමටමෙම අමාත්‍යාංශය කැපවීමෙන්කටයුතු කරමින් සිටී.

### 4.1.2 අමාත්‍යාංශයේ ප්‍රමුඛතා

1. **කඳුරට නව ගම්මාන සඳහා නිවාස ඉදිකිරීම**
   - හරිත රන් නිවාස
   - ඉන්දියානු ආධාර සහිත නිවාස
2. **පසුගාමී ප්‍රදේශයන්හී සමාජ ආර්ථික සංවර්ධනය**
   - පේළි නිවාසයන්හි වහල නැවත සෙවිලි කිරීම
   - පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම
   - ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය
   - අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
3. **ජීවනෝපායසංවර්ධනය**
   - නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව
   - ප්‍රජා සවිබල ගැන්වීම
   - සෞඛ්‍ය හා පෝෂණය

## 4.2 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ආයතනික ව්‍යුහය

### 4.2.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය මූලික වශයෙන් අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති ආයතනයක් වන වැවිලි මානව සංවර්ධන භාරය හරහාද, ඊට අමතරව ප්‍රජාශක්ති මෙහෙයුම් මධ්‍යස්ථානය, දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා මගින් ද සිදු කරනු ලබයි.

### 4.2.2 සංවර්ධන ව්‍යාපෘති හා ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය

| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය |
|---|---|
| (1) කඳුරට නව ගම්මාන සඳහා නිවාස ඉදි කිරීම | |
| (i) හරිත රන් නිවාස | - වැවිලි මානව සංවර්ධන භාරය (PHDT), වතු සේවක නිවාස සමූපකාර සමිතිය හා නිවාස ප්‍රතිලාභීන් |
| (ii) ඉන්දියානු ආධාර සහිත නිවාස | - UNHABITAT, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මානව ජනාවාස සංවිධානය, වතු සේවක නිවාස සමූපකාර සමිති, නිවාස ප්‍රතිලාභීන් හා වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) |
| (2) පසුගාමී ප්‍රදේශයන්හි සමාජ, ආර්ථික සංවර්ධනය උදෙසා යටිතල පහසුකම් සංවර්ධනය<br>(I) පේළි නිවාසවලවහල නැවතසෙවිලිකිරීම<br>(II) පානීය ජලය සැපයීම<br>(III) සනීපාරක්ෂක පහසුකම් සැපයීම<br>(IV) ළමාසංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය<br>(IV) අනෙකුත්යටිතල පහසුකම් සංවර්ධනය (ප්‍රවේශ මාර්ග/විදුලිය)<br>(V) විශේෂ ව්‍යාපෘති (ආගමික/ සංස්කෘතිකයනාදී ) | - වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) ,<br>දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා |
| (3) ජීවනෝපාය සංවර්ධනය | |
| (I) නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව | - පුල්බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන |
| (II) ප්‍රජා සවිබල ගැන්වීම<br>(III) සෞඛ්‍ය හා පෝෂණය | - වැවිලි මානව සංවර්ධන භාරය, ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන, ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල / දිස්ත්‍රික්ලේකම් කාර්යාල හා "වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා නිලධාරීන්" මගින් |

## 4.2.3 ආයතනික ව්‍යුහය



# 5 2018වර්ෂය සඳහා ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය

## 5.1 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

| වැය විෂය අංකය | වැය විෂය | පුනරාවර්තන රු. '000 | ප්‍රාග්ධන රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **පරිපාලන හා මෙහෙයුම්** | | | | |
| **140-01-01** | අමාත්‍ය කාර්යාලය | 27,475 | 7,206 | **34,681** |
| **140-01-02** | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතනික සේවා | 318,900 | 13,500 | **332,400** |
| | <u>උප එකතුව</u> | **<u>346,375</u>** | **<u>20,706</u>** | **<u>367,081</u>** |
| **සංවර්ධන වැඩසටහන්** | | | | |
| **140-02-04** | 1. ග්‍රාමීය ප්‍රදේශයන්හි ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩි දියුණු කිරීම | - | 100,000 | **100,000** |
| | 2. පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය | - | 500,000 | **500,000** |
| | 3. වතු නිවාස සංවර්ධනය (කඳුරට නව ගම්මාන සඳහා නිවාස) ( අයවැය යෝජනා ඇතුලත්ව) | - | 2,000,000 | **2,000,000** |
| | 4. හැටන්හි පිහිටා ඇති පුල්බෑන්ක්, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණුකිරීම | | | |
| | **(13)** | - | 94,000 | **94,000** |
| | **(17)** | - | 15,000 | **15,000** |
| | 5. ඉන්දීය රජයේ ආධාර මත සිදුකරන නිවාස වැඩසටහන | | | |
| | **(13)** | - | 587,000 | **587,000** |
| | **(17)** | | 90,000 | **90,000** |
| | සංවර්ධන විෂයයන්හි උප එකතුව | - | **3,386,000** | **3,386,000** |
| | **වෙන්කර ඇති මුළු ප්‍රතිපාදන (විදේශීය ප්‍රතිපාදන ද ඇතුළුව )** | ***346,375*** | ***3,406,706*** | ***3,753,081*** |

# 5.2 2018.12.31 දිනට අමාත්‍යාංශයේ වියදම් සාරාංශය

## 5.2.1 අමාත්‍යාංශයේ පරිපාලන හා මෙහෙයුම් වියදම් සාරාංශය

| | කාණ්ඩය / වැඩසටහන / ව්‍යාපෘතිය | 2018 සඳහා ප්‍රතිපාදන (රු. '000) | 2018.12.31දි නට වියදම (රු. '000) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| | **අමාත්‍යාංශයේ පරිපාලන හා මෙහෙයුම් වියදම** | | | |
| **I** | **අමාත්‍ය කාර්යමණ්ඩලය** | | | |
| 1 | පුද්ගල පඩිනඩි | 14,975 | 12,913 | 86% |
| 2 | සාමාන්‍ය පරිපාලනය | 12,500 | 11,764 | 94% |
| 3 | අමාත්‍ය කාර්යමණ්ඩලයේ පරිපාලනවියදම් එකතුව | 27,475 | 24,677 | 90% |
| 4 | අමාත්‍ය කාර්යමණ්ඩලයේ මෙහෙයුම් ප්‍රාග්ධන වියදම | 7,206 | 6,630 | 92% |
| **5** | **අමාත්‍ය කාර්යමණ්ඩලයේ මුළුවියදම් එකතුව** | **34,681** | **31,307** | **90%** |
| **II** | **අමාත්‍යාංශ කාර්යමණ්ඩලය** | | | |
| **6** | පුද්ගල පඩිනඩි | 116,900 | 109,605 | **94%** |
| **7** | සාමාන්‍ය පරිපාලනය | 202,000 | 182,015 | **90%** |
| **8** | අමාත්‍යාංශ කාර්යමණ්ඩලයේ පරිපාලන වියදම් එකතුව | ***318,900*** | ***291,620*** | ***91%*** |
| **9** | **අමාත්‍යාංශ කාර්යමණ්ඩලයේ මෙහෙයුම් ප්‍රාග්ධන වියදම** | **13,500** | **10,861** | **80%** |
| **10** | අමාත්‍යාංශ කාර්යමණ්ඩලයේ මුළු වියදම් එකතුව | ***332,400*** | ***302,481*** | ***91%*** |
| **11** | **අමාත්‍යාංශයේ මුළු පරිපාලන හා මෙහෙයුම් වියදම** | **367,081** | **333,788** | **91%** |

## 5.2.2 සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය

| | කාණ්ඩය / වැඩසටහන / ව්‍යාපෘතිය | 2018 සඳහා ප්‍රතිපාදන (රු. '000) | 2018.12.31 දිනට වියදම (රු. '000) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| | | | | |
| I | *සංවර්ධන වැඩසටහන් (දේශීය ප්‍රතිපාදන මත)* | | | |
| 1 | ජීවනෝපාය හා මූලිකපහසුකම් වැඩි දියුණු කිරීම | 100,000 | 51,440 | 51% |
| 2 | පසුගාමී ප්‍රදේශවලසමාජ ආර්ථිකසංවර්ධනය | 500,000 | 370,210 | 74% |
| 3 | කඳුරට නව ගම්මාන සඳහා නිවාස | 2,000,000 | 1,175,960 | 59% |
| 4 | ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන (17) | 90,000 | 64,294 | 71% |
| 5 | පූල්බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම (17) | 15,000 | 1,433 | 10% |
| **6** | **එකතුව** | 2,705,000 | 1,663,336 | **61%** |
| | | | | |
| **II** | *සංවර්ධන වැඩසටහන් (ඉන්දියානු රජයේ ආධාර මත)* | | | |
| 7 | ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන (13) | 587,000 | *587,000 | 100% |
| 8 | ප්‍රජාශක්ති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම (13) | 94,000 | - | - |
| **9** | **එකතුව** | **681,000** | ***587,000** | **86%** |
| | | | | |
| **10** | සංවර්ධන වැඩසටහන් මුළු එකතුව | **3,386,000** | **2,250,336** | **66%** |
| | | | | |

* රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වාර්තාව අනුව ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහනේ 2018 වර්ෂයේ වියදම රු.මි. 587 ක් ලෙස දක්වා තිබුන ද, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් එවන ලද මූල්‍ය වාර්තා අනුව තත්‍ය වියදම රු.මි. 932 කි.

## 5.2.3 ප්‍රාග්ධන වියදම් සාරාංශය

| | කාණ්ඩය / වැඩසටහන / ව්‍යාපෘතිය | 2018 සඳහා ප්‍රතිපාදන(රු. '000) | 2018.12.31 දිනට වියදම (රු. '000) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1 | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ මෙහෙයුම් ප්‍රාග්ධන වියදම | 20,706 | 17,491 | 84% |
| 2 | සංවර්ධන වැඩසටහන් (දේශීය අරමුදල්) | 2,705,000 | 1,663,336 | 61% |
| 3 | සංවර්ධන වැඩසටහන් (විදේශීය අරමුදල්) | 681,000 | 587,000 | 86% |
| | | | | |
| | මුළු එකතුව | 3,406,706 | 2,250,336 | 66% |

## 5.2.4 පුනරාවර්තන වියදම් සාරාංශය

| | කාණ්ඩය / වැඩසටහන / ව්‍යාපෘතිය | 2018 සඳහා ප්‍රතිපාදන (රු. '000) | 2018.12.31දිනට වියදම (රු. '000) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශයේ පරිපාලන හා මෙහෙයුම් වියදම | | | |
| | | | | |
| 1 | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ පරිපාලන වියදම | 27,475 | 24,677 | 90% |
| | | | | |
| 2 | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ  පරිපාලන වියදම | 318,900 | 291,620 | 91% |
| | | | | |
| | මුළු එකතුව | 346,375 | 316,297 | 91% |

## 5.2.5 අමාත්‍යාංශයේ සමස්ථ වියදම් සාරාංශය

| | කාණ්ඩය / වැඩසටහන / ව්‍යාපෘතිය | 2018 සඳහා ප්‍රතිපාදන (රු. '000) | 2018.12.31 දිනටවියදම (රු. '000) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම | 346,375 | 316,297 | 91% |
| | ප්‍රාග්ධන වියදම | | | |
| 2 | මෙහෙයුම් | 20,706 | 17,491 | 84% |
| 3 | සංවර්ධන වැඩසටහන් (දේශීය අරමුදල්) | 2,705,000 | 1,663,336 | 61% |
| 4 (1+2+3) | දේශීය අරමුදල් එකතුව | 3,072,081 | 1,997,124 | 65% |
| 5 | විදේශීය අරමුදල් (සංවර්ධන වැඩසටහන් ) | 681,000 | 587,000 | 86% |
| 6 (4+5) | මුළු එකතුව | 3,753,081 | 2,584,124 | 69% |

# 6 සංවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය

## 6.1 කඳුරට නව ගම්මාන සඳහා නිවාස

වාසස්ථාන සම්බන්ධයෙන් වන දර්ශක සැලකීමේදී ද, වඩාත් පසුබෑමකට ලක්ව ඇති ජන කොට්ඨාශය ලෙස වැවිලි ප්‍රජාව සැලකිය හැක. වැවිලි ප්‍රජාව ජීවත් වන නිවාස වලින් 58% කට අධික ප්‍රමාණයක් පේළි නිවාස වන අතර එම නිවාස "ලැයින් කාමර" වශයෙන් හඳුන්වනු ලබයි. (ජාතික මට්ටමින් ගත් කල මෙවැනි නිවාසයන්හි ප්‍රතිශතය 3.8%කි). මීට ශතවර්ෂ දෙකකට පමණ පූර්ව කාලයකදී බ්‍රිතාන්‍ය වතු පාලකයින් විසින් වතු සේවකයින් සඳහා ඉදි කරන ලද ඉතා පැරණි මෙම පේළි නිවාස බොහොමයක් වර්තමානය වනවිට ඉතා අබලන් තත්ත්වයකට පත්ව ඇත. හිරු එළිය හා වාතාශ්‍රය අවම වීම, අධික තදබදය, පෞද්ගලිකත්වයක් නොමැති වීම, අනු පවුල් බිහිවීම නිසා පවුල් කිහිපයකට එක් කාමරයක් තුල ජීවත් වීමට සිදුවීම මෙන්ම විවිධ වූ අපචාරයන්ට ගොදුරු වීම, අනාරක්ෂිත බව, සමාජ පිළිගැනීමක් නොමැති වීම, සෞඛ්‍යයට හා ළමුන්ගේ අධ්‍යාපනයට නුසුදුසු වටපිටාවක් පැවතීම ඇතුළු බොහෝමයක් සමාජයයීය ගැටලු මෙමගින් නිර්මාණය වී ඇත.

### වැවිලි ක්ෂේත්‍රයතුල මෙවැනි නිවාස තුන් වර්ගයක් පමණ පවතී.

### 1 තනි බැරැක්ක ( Single Line Houses )

ඉදිරිපස ආලින්දයක් සහිත තනි කාමරයකින් සමන්විතය.ආලින්දය වර්ග අඩි ($ft^2$) 25 කි. මුළු නිවස වර්ග අඩි 264 ක් වන අතර එය ආලින්දයකින්, නිදන කාමරයකින් හා කුඩා මුළුතැන්ගෙයකින් සමන්විත වේ. වැවිලි ක්ෂේත්‍රය තුල මෙවැනි පේළි නිවාස 11,599 ක් පමණ හඳුනාගෙන ඇත. ඊට නිවාස ඒකක 73,539 ක් පමණ ඇතුලත් වී ඇති අතර ඒවායෙහි පවුල් 81,900 කට අධික ප්‍රමාණයක් ජීවත් වේ.

### 2. යුගල බැරැක්ක (Double Line Houses )

යුගල බැරැක්කඉදිරිපස ආලින්දයක් සහිත, එක් පසකට පේළියකට පිහිටි කාමර 10 - 12 කින් සමන්විත වේ මෙහි දෙපස පවුල් 02 ක් ජීවත්වේ. බිම් වර්ග ප්‍රමාණය වර්ග අඩි (ft2) 145 -175 පමණවේ. දැනට මෙවැනි නිවාස 5,468 ක් හඳුනාගෙන ඇති අතර ඊට නිවාස ඒකක 69,613 ක් ඇතුලත් වී ඇත. පවුල් 76,305 ක් පමණ මෙම නිවාසවල ජීවත්වන බව හඳුනාගෙන ඇත..

### 3. තාවකාලික නිවාස

වැවිලි ක්ෂේත්‍රය තුල ක්‍රමිකව පවුල් සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ පවතින පේළි නිවාස ප්‍රමාණය එම ක්ෂේත්‍රයේ ශ්‍රමිකයන්ට ප්‍රමාණවත් නොවූ බැවින්, පවතින පේළි නිවාසවලට යාබදව ඉඩ ඇති ස්ථානවල තාවකාලික නිවාස ඉදිකර ඇත. ටකරන් තහඩු සහ ඉටිරෙදි යොදා තනා ඇති මෙම නිවෙස් ඉතා අඩු පහසුකම් වලින් යුක්තය. වතු ක්ෂේත්‍රයේ මෙවැනි තාවකාලික නිවාස 13,814 ක් තුල පවුල් 14,500 කට අධික ප්‍රමාණයක් ජීවත්වේ.

තොරතුරු මූලාශ්‍රය: (Annual Helth Return - වැවිලි මානව සංවර්ධන භාරය 2016 )

වාසස්ථාන සම්බන්ධයෙන් වැවිලි ප්‍රජාව අත්විඳින්නා වූ දුෂ්කරතා මහ හරවා අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙත ද හිමි කර දීමේ අභිලාශයෙන්, රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත පදනම්ව ආරම්භ කරන ලද “වතු නිවාස සංවර්ධන වැඩසටහන” 2015 වර්ෂයට පෙර “නව ජීවන නිවාස වැඩසටහන” ලෙසද, 2015 වර්ෂය තුල රජයේ දින 100 වැඩසටහනට සමගාමීව විශේෂ ව්‍යාපෘතියක් ලෙසද ක්‍රියාවට නංවන ලදී.

මෙම නිවාස වැඩසටහන 2016 වර්ෂයේ සිට “හරිත රන් නිවාස වැඩසටහන” ලෙස ක්‍රියාවට නංවන ලද අතර එය කොන්ත්‍රාත් පදනම මත හා ප්‍රතිලාභී මූලිකත්වය පදනම් කරගනිමින් දෙ ආකාරයකින් ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම අමාත්‍යාංශය විසින් නව නිවාස ලබා දීමේ වැඩසටහන තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා විදේශීය සහයෝගය හා පුද්ගලික අංශයේ හවුල්කාරීත්වයද ලබා ගැනීමට කටයුතු කරන ලදී.

නාය යාමට ලක්වූ හා නාය යාමේ අවදානමක් සහිත වතු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වන ජනතාවට හා වතු සේවක පවුල් සඳහා ප්‍රමුඛත්වය දෙමින් මෙම නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර ඊට සමගාමීව එම නව නිවාස සඳහා අවශ්‍ය යටිතල පහසුකම් එනම්, පානීය ජල පහසුකම්, විදුලිය සහ පිවිසුම් මාර්ග ලබාදීමේ ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවේ.

නිවසක අයිතිය පමණක් නොව ඉඩම් අයිතිය ද හිමිකර දීමේ අභිලාෂයෙන් නව රජය විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් මත වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා ඉඩම් අමාත්‍යාංශය එක්ව නිවාස ප්‍රතිලාභීන් සඳහා නිරවුල් ඉඩම් ඔප්පු හිමිකම ලබාදීමද අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර එහි ප්‍රථම අදියර, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. එම වර්ෂය තුලදී, නුවරඑළිය හා ගාල්ල යන දිස්ත්‍රික්කවල තෝරාගත් පවුල් 446 ක් සඳහා නිරවුල් ඔප්පු ප්‍රදානය සිදුකර ඇති අතර 2018 වර්ෂය තුලදී, නුවරඑළිය, ගාල්ල හා බදුල්ල යන දිස්ත්‍රික්කවල තෝරාගත් පවුල් 808 ක් සඳහා නිවාස අයිතිය හා නිරවුල් ඔප්පු හිමිකම පවරා දෙන ලදී. අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන සෑම නිවාස ව්‍යාපෘතියක් සඳහාම හිමිකම් ඔප්පු ලබාදීම අමාත්‍ය මණ්ඩල තීරණ මත අදියර වශයෙන් සිදු කරනු ලබන අතර මේ වන විට දේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස 5,561 ක් හා ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස 14,000 සඳහා හිමිකම් ඔප්පු ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

## 6.1.a අමාත්‍යාංශය මගින් 2018 වර්ෂයතුලදී හිමිකම් ඔප්පු ප්‍රදානය පිළිබඳ විස්තර

| ප්‍රාදේශීයකාර්යාලය | වත්තේ නම | කොටස | නිකුත් කරන ලද ඔප්පු සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| දේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද නිවාස සඳහා ලබාදුන් හිමිකම් ඔප්පු | | | | |
| නුවරඑළිය | හුට්විල් | ෆැන්කටන් | 71 | |
| | ඇලිබියන් | Ardlaw | 7 | |
| | කෝට්ලොජ් | කෝට්ලොජ් | 19 | |
| | ඩෙස්ෆෝඩ් | | 23 | |
| | ක්ලැරන්ඩම් | | 9 | |
| | නුවරඑළිය | පහළ | 11 | |
| | කොන්කෝඩියා | ඉහළ | 2 | |
| | ටොරින්ටන් | ස්ටෙයාර් | 11 | |
| | රාගල | මිඩ්ල් | 29 | |
| | ක්වින්ස්බරි | | 23 | |
| | ෂීන් | ඉහළ | 11 | |
| හැටන් | යුලිෆීල්ඩ් | යුලිෆීල්ඩ් | 14 | |
| | බඹරකැලේ | රහන්වත්ත | 18 | |
| | | බඹරකැලේ | 14 | |
| | බ්‍රවුන්ස්වික් | බ්‍රවුන්ස්වික් | 20 | |
| | ස්ටොනික්ලිෆ් | රොසිටා | 21 | |
| | ක්‍රිස්ටෙලාස්ෆාම් | ක්‍රිස්ටෙලාස්ෆාම් | 15 | |
| | ඉන්ජෙස්ට්‍රි | බෙරුට් | 20 | |
| | මොබා | මිද්ලොකියන් | 20 | |
| | ස්ට්‍රැතස්පි | මිනන් | 12 | |
| | දික්ඔය | දරාවෙල | 21 | |
| | කිව් | සෙන්. ජෝන්දෙල්රේ | 5 | |
| | ගෞරවිල | | 10 | |
| | කැනිල්වර්ත් | | 2 | |
| බදුල්ල | අම්පිටිකන්ද | පහළ | 50 | |
| ගාල්ල | හුලන්මඩුව | මේන් | 25 | |
| | සිට්රස් | නාකුඩුම්බිය | 12 | |
| | ෆොජෙස්ටර් | ගෝවින්න | 6 | |
| | පල්ලෙගොඩ | ඉහළ | 8 | |
| | ගිකියනකන්ද | බටහිර | 23 | |
| | ඇල්පිටිය | කිතුල්විටිගල | 19 | |
| | තලන්ගල්හ | Besjour | 15 | |
| | හෝමදොල | අංක.01 | 13 | |
| | වල්පිට | වවුලාගල | 22 | **601** |
| ඉන්දියානු ආධාර මත ක්‍රියාත්මක කරන ලද නිවාස සඳහා ලබාදුන් හිමිකම් ඔප්පු | | | | |
| නුවරඑළිය | ඩන්සිනන් | | 207 | 207 |
| මුළු එකතුව | | | **808** | **808** |

## 6.1.b 2018 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද නිවාස වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය

| | වැඩසටහන / ව්‍යාපෘතිය | | 2018 සඳහා ප්‍රතිපාදන (රු. මි.) | 2018.12.31 දිනට වියදම (රු. මි.) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| 1 | දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන නිවාස වැඩසටහන *(හරිත රන් නිවාස වැඩසටහන )* | 11 | 2,000 | 1,176 | 59% |
| 2 | ඉන්දියානු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන නිවාස වැඩසටහන | 13 | 587 | 587 | 100% |
| | | 17 | 90 | 64 | 71% |
| | එකතුව | | **2,677** | **1,827** | **68%** |

## 6.1.1 "හරිතරන්"නිවාස යෝජනා ක්‍රමය (Green Gold) නව ගම්මාන සංකල්පය යටතේ - (New Village Concept)

රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත අරඹන ලද **"හරිත රන්"** නිවාස යෝජනා ක්‍රමය යටතේ 2018 වසර සඳහා නිවාස 1,566 ක් ඉදිකිරීමට අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී ඇති අතර එම නිවාසයන්හි ඉදිකිරීම් බිත්ති මට්ටම දක්වා නිම කිරීම ඉලක්ක කරමින් ඒ සඳහා රු. මි. 450 ක මුදලක් වෙන් කරන ලදී. මෙම නිවාස ඉදිකිරීම් අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කරන ලද අතර නිවාස 571 ක්පළමු අදියර යටතේද, නිවාස 995 ක් දෙවන අදියර යටතේද ක්‍රියාත්මක විය. පළමු අදියරේ ක්‍රියාත්මක කරන ලද නිවාසයන්හි මූලික ගෙවීම් (Mobolization advance) වෙනුවෙන් රු.මි. 142 ක් ද දෙවන අදියරේ ක්‍රියාත්මක කරන ලද නිවාස 761 ක භූමි සකස් කිරීමේ කටයුතු සඳහා මුදල රු.මි. 52 ක් ද 2018 වර්ෂය තුළදී ගෙවා නිමකර ඇත.

එමෙන්ම, හරිත රන් නිවාස ක්‍රමය යටතේ2018 වර්ෂය සඳහා අවිච්ඡේදව පැවති තවත් නිවාස ඒකක 2,567 වැඩ නිම කිරීම හා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් රු.මි. 1,500 ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඒ අනුව, 2016 වර්ෂයේ අවිච්ඡේදව පැවති නිවාස 440 න් නිවාස 15 ක හා 2017 වර්ෂයෙන් අවිචච්ඡේදව පැවැති නිවාස 2,127 න් නිවාස 844 ක ඉදිකිරීම් 2018 වර්ෂය තුළදී අවසන් කරන ලදී.ඉතිරි නිවාසන්හි ඉදිකිරීම් ක්‍රියාත්මක මට්ටමේ පවතී. එමෙන්ම 2016 වර්ෂයේදී නව ජීවන නිවාස යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද, ඉඩම් ගැටළු හේතුවෙන් වැඩ ආරම්භ නොකරන ලද ස්ටෙලන්බර්ග් වතුයායේ ඉදි කරනු ලබන නිවාස 40 හි ඉදිකිරීම් කටයුතු මෙම වර්ෂයේදී නැවත ආරම්භ කරන ලදී.

නුවරඑළිය, බදුල්ල, හැටන්, කෑගල්ල, රත්නපුර, මහනුවර හා ගාල්ල යන වැවිලි ප්‍රදේශ ආවරණය වන පරිදි හරිත රන් නිවාස යෝජනා ක්‍රමය යටතේ ඉදි කෙරෙන එක් නිවසක වටිනාකම රු: 1,000,000/= ලෙසට ඇස්තමේන්තු ගතකරඇති අතර මෙම නිවාස ඉදි කිරීම සඳහා වැය කෙරෙන මුදලෙන් 48% රජයේ ප්‍රදාන වශයෙන්ද, ඉතිරි 52% ණය මුදල් වශයෙන් ද ලබා දේ. විදුලිය, ජලය, ප්‍රවේශ මාර්ග වැනි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා එක් නිවසක් වෙනුවෙන් රු. 200,000.00 වෙන් කරනු ලැබේ. ඒ අනුව එක් නිවසක වටිනාකම රු. 1,200,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

### 6.1.1.1. හරිත රන් නිවාස ක්‍රමය යටතේ 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් වෙන්කරන ලද නිවාස සංඛ්‍යාව හා භෞතික ප්‍රගතිය ( 2018.12.31 දිනට )

| ප්‍රාදේශීය කාර්යාලය | 2018 නව නිවාස පළමු අදියර | 2018 නව නිවාස දෙවන අදියර | 2017 වර්ෂයේ අවිච්ඡේද නිවාස | 2016 වර්ෂයේ අවිච්ඡේද නිවාස | මුළු නිවාස ඒකක ගනන | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | නිම කල | ක්‍රියාත්මක වෙමින් පවතින |
| ගාල්ල | 35 | 50 | 252 | 05 | **342** | | 46 | 296 |
| රත්නපුර | 30 | 55 | 238 | 47 | **370** | | 69 | 301 |
| බදුල්ල | - | - | 290 | - | **290** | | 204 | 86 |
| කෑගල්ල | 38 | 61 | 82 | 68 | **249** | | 77 | 172 |
| මහනුවර | 58 | 85 | 218 | 40 | **401** | | 101 | 300 |
| හැටන් | 235 | 480 | 651 | 151 | **1,517** | | 220 | 1,297 |
| නුවරඑළිය | 175 | 264 | 396 | 129 | **964** | | 127 | 837 |
| | | | | | | | | |
| **එකතුව** | **571** | **995** | **2,127** | **440** | **4,133** | | **844** | **3,289** |
| **මුළු එකතුව** | **4,133** | | | | **4,133** | | **4,133** | |

## 6.1.2 "ඉන්දියානු ආධාර" යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

ඉන්දියානු රජයේ සහාය යටතේ ආරම්භ කර ඇති මෙම නිවාස ව්‍යාපෘතිය මගින් වැවිලි ප්‍රජාව වෙත නිවාස ඒකක 14,000 ක් ඉදිකිරීමට නියමිත ව ඇත. මෙය අදියරයන් දෙකක් යටතේ ක්‍රියාත්මක වන අතර පළමු අදියර (Stage 01) යටතේ නිවාස ඒකක 4,000 ක් හා දෙවන අදියර (Stage 02) යටතේ නිවාස ඒකක10,000 ක් ක්‍රියාත්මක කරනු ලබයි. එක් නිවසක වටිනාකම රුපියල් මිලියනයක් ලෙසට ඇස්තමේන්තු ගත කර ඇති මෙම ව්‍යාපෘතිය සඳහා, නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රු: 950,000/= ක්ද, අදාල වැවිලි සමාගම විසින් රු:30,000/= ක් හා ප්‍රතිලාභියා විසින් රු: 20,000/= ක්ද දායකත්වයක් සපයනු ලබයි. මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලිය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ශ්‍රී ලංකා රජය මගින් සපයනු ලබයි.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර පියවර දෙකක් යටතේ ක්‍රියාත්මක වන අතර පළමු පියවර (Phase 01) යටතේ නිවාස ඒකක 1,134 ක් හා දෙවන පියවර යටතේ (Phase 02) නිවාස ඒකක2,866 ක් ඉදි කිරීමට නියමිතව තිබුනද ඉඩම් ගැටළු හේතුවෙන් පළමු පියවර යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ නිවාස ඒකක 21ක් දෙවන පියවරට ඇතුලත් කරන ලදී. ඒ අනුව පළමු පියවර සඳහා නිවාස ඒකක 1,113 ක් හා දෙවන පියවර සඳහා නිවාස ඒකක 2,887 ක් ක්‍රියාවට නංවමින් සිටී.

නිවාස ඉදි කිරීම් වෙනුවෙන් රු.මි. 365 ක් 2017 වර්ෂයේදී දරන ලද අතර පළමු පියවරේ නිවාස ඒකක 100 වැඩ එම වර්ෂයතුල අවසන් කරන ලදී. 2018 වර්ෂය තුලදී පළමු පියවරේ ඉතිරි නිවාස 1,013 හි ඉදිකිරීම් නිම කිරීමට හා දෙවන පියවර යටතේ ක්‍රියාත්මක කරනු ලබන නිවාස ඒකක 2,887 ඉදිකිරීම් ආරම්භ කර අත්තිවාරම් මට්ටම සම්පූර්ණ කිරීමට 2018 අයවැය ප්‍රතිපාදන තුලින් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු:මි. 90 ක් ද ඉන්දියානු ප්‍රතිපාදනවශයෙන් රු.මි. 587 ක් ද වශයෙන් වෙන්කර තිබිණ.

## 6.1.2.1 "ඉන්දියානු ආධාර" යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

| ප්‍රතිපාදන | ශීර්ෂය | 2018 සඳහා ප්‍රතිපාදන (රු. '000) | 2018.12.31 දිනට වියදම (රු. '000) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ඉන්දියානු රජයේ ආධාර | (13) | 587,000 | 587,000 | 100% |
| රාජ්‍ය ප්‍රතිපාදන | (17) | 90,000 | 64,294 | 71% |
| | **මුළු එකතුව** | **677,000** | **651,294** | **96%** |

## 6.1.2.2 පළමු පියවර (Phase 01)

ප්‍රථම පියවරේ ඉදිකරනු ලබන නිවාස ඒකක 1,113 අතුරින් ඉන් නිවාස 100 ක් 2017 වර්ෂය තුළදී නිම කරන ලද අතර ඉතිරි නිවාස ඒකක 1,013 අතුරින් 2018 වර්ෂය අවසන් වනවිට නිවාස ඒකක 651 ක ඉදිකිරීම් අවසන් කොට තවත් නිවාස ඒකක 180 ක ඉදිකිරීම් අවසන් අදියර දක්වා ක්‍රියාත්මක කර ඇත. ඉතිරි නිවාසඒකක 182 හි ඉදිකිරීම් විවිධ අදියරයන්හි පවතී.මේ සඳහා රජයේ ප්‍රතිපාදන යටතේ රු.මි. 64 ක් හා ඉන්දියානු ප්‍රතිපාදන යටතේ රු.මි. 932 ක් 2018 වර්ෂය තුලදී වැය කර ඇත.

## 6.1.2.3 "ඉන්දියානු රජයේ සහාය යටතේ ඉදිවන" නිවාස ව්‍යාපෘතියේ පළමු පියවරෙහි භෞතික ප්‍රගතිය (2018.12.31දිනට)

| භෞතික ප්‍රගතිය | වතුයාය | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | බොගවාන | ඩන්සිනන් | ඩයගම බටහිර | හෙල්බොඩ | ලෙජර්වත්ත | |
| 2017 වර්ෂයේදී නිම කල නිවාස සංඛ්‍යාව | 04 | 38 | 58 | - | - | 100 |
| 2018 වර්ෂයේදී නිම කල නිවාස සංඛ්‍යාව | 96 | 245 | 92 | 98 | 120 | 651 |
| ඉදිකිරීම් අවසන් අදියරේ ඇති නිවාස සංඛ්‍යාව | 127 | 48 | - | - | 5 | 180 |
| ඉදිකිරීම් විවිධ අදියරයන්හි පවතින නිවාස සංඛ්‍යාව | 128 | 52 | | 2 | - | 182 |
| **එකතුව** | **355** | **383** | **150** | **100** | **125** | **1,113** |

## 6.1.2.4 දෙවන අදියර

මේ යටතේ, නාය යාමෙන් පීඩාවට පත්වූවන් හා නායයාමේ අවදානමට ලක් විය හැකි අධි අවදානම් ප්‍රදේශවල ජීවත් වන ජනතාව වෙනුවෙන් ප්‍රමුඛතාව දෙමින් නිවාස ඒකක 2,887 ක් ඉදිකිරීමට ක්‍රියාත්මක කිරීම සඳහා අදාල වතු සමාගම්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා එක්ව ඉඩම් හඳුනා ගැනීම සිදුකර ඇති අතර නිවාස ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

### 6.1.3 නිවාස ණය වාරික අයකරගැනීම

හරිත රන් නිවාස යෝජනා ක්‍රමය යටතේ ඉදි කෙරෙන එක් නිවසක වටිනාකම (විදුලිය, ජලය, ප්‍රවේශ මාර්ග වැනි යටිතල පහසුකම් සංවර්ධනයට අමතරව) රු: 1,000,000/= ලෙසට ඇස්තමේන්තු ගතකර ඇති අතර මෙම නිවාස ඉදි කිරීම සඳහා වැය කෙරෙන මුදලෙන් 48% රජයේ ප්‍රදාන වශයෙන්ද, ඉතිරි 52% ණය මුදල් වශයෙන් ද ලබා දේ. ඒ අනුව, 2015 වර්ෂයේ සිට මේ දක්වා ලබාදුන් නිවාස වෙනුවෙන් නිවාස ණය වශයෙන් රු.මි. 58 ක මුදලක් නැවත අයකරගෙන ඇත.

## 6.1.4 අමාත්‍යාංශය මගින් ඉදිකරනු ලබන නිවසක සැළැස්ම




ඉදිරිපස පෙනුම

නිවාස සැළැස්ම



# 6.2 පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය

ඉතා අවම පහසුකම් යටතේ ජීවත් වන වතු ජනතාව සඳහා පානීය ජල ව්‍යාපෘති ඇති කිරීම, වැසිකිළි පහසුකම් ලබා දීම, ප්‍රවේශ මාර්ග අලුත් වැඩියාව / ඉදිකිරීම, පඩිපෙළවල් ඉදි කිරීම, ලයින් කාමර වහල නැවත සෙවිලි කිරීම, ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම, ආගමික සහ සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම යනාදී විවිධ වූ සංවර්ධන ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

එයට අමතර වශයෙන් හදිසි ආපදා තත්ත්වයනට පත්වූ වැවිලි ප්‍රජාව වෙනුවෙන් තාවකාලික වාසස්ථාන සකස් කිරීම හා ඊට අවශ්‍ය පහසුකම් සැලසීමද මේ යටතේ ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශය යටතේ පවතින වැවිලි මානව සංවර්ධන භාරයේ නුවරඑළිය, හැටන්, බදුල්ල, කෑගල්ල, මහනුවර, රත්නපුර හා ගාල්ල යන ප්‍රාදේශීය කාර්යාල මගින් හා දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා මගින් ද මෙම පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධන පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සිදු කරනු ලබයි. මේ සඳහා රුපියල් මිලියන 500 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මෙම වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වනවිට එහි මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 370 ක් වේ.

## 6.2.1 2018 වසරේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා එහි ප්‍රගතිය.

### 6.2.1.1 වහල දිරාපත්වීම හේතුවෙන් වාසස්ථානයකට නුසුදුසු තත්ත්වයේ ඇති පේළි නිවාසයන්හි පියසි නැවත සෙවිලි කිරීම.

සමස්ථ වැවිලි ප්‍රජාව වෙනුවෙන් නව නිවාස ඉදිකිරීම දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් වන බැවින්, එතෙක් එම ප්‍රජාවගේ වාසස්ථානයන්හි තත්ත්වය ඉහළ නැංවීමේ අතුරු පියවරක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

2018 වර්ෂයේදී නිවාස ඒකක 1200 ක පියසි නැවත සෙවිලි කිරීම සඳහා රු.මි. 40 ක් වෙන්කර ඇත. ඒ අනුව, 2018 වර්ෂය තුලදී රුපියල් මිලියන 39 ක මුදලක් වැය කරමින්, 2017 වර්ෂයේ අවිච්ඡේදව පැවැති නිවාස ඒකක 880 ක හා තවත් නිවාස ඒකක 15 ක පියසි නැවත සෙවිලි කිරීම මෙම අමාත්‍යාංශය විසින් සිදු කර ඇති අතර ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රගතිය 98 % කි.

### 6.2.1.2 සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම.

ජල උල්පත් බොහොමයක් වතු ජනාවාස ආශ්‍රිතව ස්ථාන ගත වී ඇති කඳුකර ප්‍රදේශයෙන් ආරම්භ වුවද සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව වතු ජනතාව වෙත හිමි වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ජල සැපයුම් අනාරක්ෂිතව තිබීම හේතුවෙන් ජලය මගින් පැතිරී යන පාචනය වැනි රෝග බොහොමයකට ගොදුරු වීමේ වැඩි අවදානමක් වැවිලි ප්‍රජාවතුල පවතින බැවින්, එසේ හඳුනාගත් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කර ඇත.

මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාවට නංවනු ලබන 2016 - 2020 ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුව හා අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන ද පදනම් කරගනිමින් 2020 වර්ෂය අවසන් වන විට ජල සම්පාදන යෝජනා ක්‍රම 400ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර ඒ සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කර ඇත.

- නව ජල ධාරාවන් සහ ජල උල්පත් හඳුනා ගැනීම
- ජල ධාරාවන් සහ ජල උල්පත් ආරක්ෂා කිරීම සඳහා ඒ අවට පිහිටි රක්ෂිත ප්‍රදේශයන්ට අයත් සීමාවන් ලකුණු කිරීම
- විවෘත ප්‍රදේශයන් හි මළපහ කිරීම වැළැක්වීමට වතුවල විවේකාගාර ඉදි කිරීම
- ජල සම්පාදන හා ජල පෙරන ක්‍රමයන් හඳුන්වා දීම
- ජල මූලාශ්‍ර සංරක්ෂණය
- ප්‍රතිලාභ දායකත්ව යෝජනා ක්‍රමය හඳුන්වා දීම. (මෙය දැනටමත් ක්‍රියාත්මක වේ. )

සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය යටතේ ජල ව්‍යාපෘති 50 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂය වෙනුවෙන් රු.මි. 30 ක් වෙන්කරන ලදී. ඒ අනුව, 2017 වර්ෂයේ අවිච්ඡේදව පැවැති ව්‍යාපෘති 27 ක් අතුරින්, ව්‍යාපෘති 16 ක වැඩ 2018 වර්ෂයේදී අවසන් කර ඇති අතර තවත්, ව්‍යාපෘති 11 ක්‍රියාත්මක වෙමින් පවතී. 2018 වර්ෂයේදී නව ජල සම්පාදන ව්‍යාපෘති 24 ක් ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර ඉන් ව්‍යාපෘති දෙකක වැඩ අවසන් කර ඇත. 2018.12.31 දිනට ජල සම්පාදන ව්‍යාපෘති සඳහා වැයකර ඇති මුදල රු.මි. 20 ක් වන අතර අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය 67 % කි.

## 6.2.1.3 සනීපාරක්ෂක පහසුකම් සැපයීම

දත්ත සමීක්ෂණ වාර්තා අනුව වැවිලි ප්‍රජාවගෙන් 45 % කට අධික ප්‍රමාණයක් සඳහා වැඩි දියුණු කල සනීපාරක්ෂක පහසුකම් ලැබී නොමැති බව පෙනී යයි. ලයින් කාමර වල ජීවත් වන එම ජනතාව වෙනුවෙන් ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ අරමුණින් 2016 – 2020 යන වසර පහතුලදී නව වැසිකිලි 10,000 ක් නිම කිරීමට අපේක්ෂා කෙරේ.

2018 වර්ෂය තුලදී, අවිච්ඡේදව පැවැති වැසිකිලි ඉදිකිරීම් 293 ක් හා නව වැසිකිලි 100 ක් ඉදිකිරීම සඳහා රු.මි. 24 ක ප්‍රතිපාදන වෙන්කරන ලදී. අවිච්ඡේදව පැවැති ඉදිකිරීම් වලින් වැසිකිලි 209 ක ඉදිකිරීම් අවසන් කර ඇති අතර ඉතිරි වැසිකිලි 84 හි වැඩ 2019 වර්ෂයේ පළමු කාර්තුවේදී අවසන් කිරීමට නියමිතය. 2018.12.31 දිනට සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය රු.මි. 23 කි.

## 6.2.1.4 ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම / නවීකරණය කිරීම

ශ්‍රී ලංකාව තුල වැවිලි ක්ෂේත්‍රය ආරම්භ වූ මුල් යුගයේ පටන් රැකියාවන් හි නිරත වැවිලි ප්‍රජාවගේ අවු 02 – 05 දක්වා ළමුන්ගේ රැකවරණය ළමා සංවර්ධන මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක විය. වයස අවුරුදු 2 ට අඩු දරුවන් රැක බලා ගැනීම හා අවුරුදු 3-5 අතර ළමයින්ගේ සමාජ ක්‍රියාකාරකම් වර්ධනය, ස්ව භාෂාව දියුණු කිරීම, සෞන්දර්යය කුසලතාවයන් හා බුද්ධිමය හැකියාවන් වර්ධනය, දරුවන් පාසල් අධ්‍යාපනයට හුරු කිරීම යනාදී කාර්යයන් රැසක් ළමා සංවර්ධන මධ්‍යස්ථාන හරහා සිදු කරනු ලබයි. ඒ අනුව වතු කළමණාකාරීත්වය යටතේ මේ වනවිට ළමා සංවර්ධන මධ්‍යස්ථාන 1,544 කට වැඩි සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලබයි.

ඉඩ පහසුකම් නොමැතිවීම, උපකරණ හිඟවීම, නිසි නඩත්තුවක් නොවීම, රැකවරණය සපයන්නන්ගේ හා ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය යනාදී කරුණු පදනම් කරගනිමින් කරන ලද ප්‍රමිති වර්ගීකරණය අනුව මෙම මධ්‍යස්ථාන අතුරින් 62% ක් "ඒ" සහ "බී" ශ්‍රේණි ලෙසද වඩාත් අවම පහසුකම් ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථාන 550 ට අධික සංඛ්‍යාවක් (38%) "සී" සහ "ඩී" ශ්‍රේණි ලෙසද,ශ්‍රේණිගත කොට ඇත. එසේ "සී" සහ "ඩී" ශ්‍රේණි ලෙස හඳුනාගත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන කඩිනමින් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඇත.

රජයේ අරමුදල් යටතේ ළමා සංවර්ධන මධස්ථාන 100ක්, වර්ෂ 2020 වන විට සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය විසින් සිදුකරමින් සිටින අතර 2017 වර්ෂය අවසන්වන විට රු.මි. 22 ක පිරිවැයක් දරමින් මධ්‍යස්ථාන 28 ක් සංවර්ධනය කර ඇත.

2018 වර්ෂය සඳහා නව ළමා සංවර්ධන මධස්ථාන 07 ක් හා අවිච්ඡේදව පැවති ළමා සංවර්ධන මධ්‍යස්ථාන 19 ක් සංවර්ධනය වෙනුවෙන් රු.මි. 10 ක් වෙන් කරන ලද අතර 2018.12.31 දිනට එහි මූල්‍ය පිරිවැය රු.මි. 9 ක් වේ. 2018 දෙසැම්බර් මස 31 දින වනවිට අවිච්ඡේදව පැවැති ළමා සංවර්ධන මධ්‍යස්ථාන 11 ක වැඩ අවසන් කර ඇත.2018 වර්ෂයේ ආරම්භ කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන 05 ක් අතුරින් මධ්‍යස්ථාන 02 ක ඉදිකිරීම් ද අවසන් කර ඇත.

මීට අමතරව ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ (2015 – 2020) තෝරාගත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය ඇතුළුව මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 10 ක මුදලක් ද වෙන්කර ඇත.

## 6.2.1.5 වතු රෝහල් මාර්ග හා ප්‍රවේශ මාර්ග සංවර්ධනය

ජාතික සෞඛ්‍ය සේවාවන්හි ප්‍රතිලාභ වැවිලි ප්‍රජාව වෙත ලබා ගැනීමට ඇති ප්‍රධාන බාධාවක් වන්නේ දුෂ්කර තත්ත්වයේ පවතින මාර්ග ජාල පද්ධතියයි.එබැවින් වතු ආසන්නව රජයේ රෝහල් හා සහසම්බන්ධවන රෝහල් මාර්ග පද්ධති සංවර්ධනය කිරීම ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සුවිශේෂී කර්තව්‍යයක් ලෙසට හඳුන්වා දී ඇත. එමෙන්ම වැවිලි ප්‍රදේශයන්හි ඉතා අබලන් තත්ත්වයේ පවතින වතු නිවාස ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමද මෙම අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබයි.

රජයේ රෝහල් වෙත නිසි ප්‍රවේශ මාර්ග නොමැති වතු කෙරෙහි වැඩි අවධානය යොමු කරමින්, රෝහල් මාර්ග කිලෝ මීටර් 25 ක දුර ප්‍රමාණයක් හෝ අවම වශයෙන් රෝහල් මාර්ග 20 ක් සංවර්ධනය කිරීම සඳහාත් වතු ප්‍රවේශ මාර්ග 150ක් සංවර්ධනය කිරීම සඳහාත් 2018වර්ෂයේදී රු.මි. 200 ක් වෙන්කරන ලදී. ඒ අතුරින්වතු ප්‍රවේශ මාර්ග 275 ක් සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී ඇති අතර 2018 වර්ෂය අවසන් වන විට ඉන් මාර්ග 88 ක සංවර්ධන කටයුතු අවසන් කර ඇත. එමෙන්ම 2017 වසරේ සිට අවිච්ඡේදව පැවැති වතු රෝහල් මාර්ග 12 අතුරින් මාර්ග 07 ක සංවර්ධන කටයුතු ද අවසන් කර ඇත. වතු රෝහල් මාර්ග හා ප්‍රවේශ මාර්ග සංවර්ධනය වෙනුවෙන් 2018.12.31 දිනට වැයකර ඇති මුදල රු.මි.147 ක් වන අතර ව්‍යාපෘතියේ සමස්ථ මූල්‍ය ප්‍රගතිය 74 % කි.

### 6.2.1.6 නව නිවාස සඳහා යටිතල පහසුකම් සංවර්ධනය

කඳුරට නව ගම්මාන සංකල්පය යටතේ ඉදිකරනු ලබන නව නිවාසයන්හි පොදු පහසුකම් සංවර්ධනය සඳහා මෙම අමාත්‍යාංශය විසින් නිවසක් ඉදිකිරීමේ පිරිවැය වන රු. 1,000,000.00 ට අමතරව එක් නිවසකට රු. 200,000.00 අධික අමතර පිරිවැයක් ද දරනු ලබයි. මේ අනුව නිවාස ව්‍යාපෘති සඳහා අවශ්‍ය විදුලිය, ජලය හා ප්‍රවේශ මාර්ග වැනි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෙන්ම ආපදා තත්ත්ව අවම කිරීමේ ව්‍යාපෘති සඳහා ද අමාත්‍යාංශය විසින් මෙම වර්ෂයේදී අමතර රු.මි.70 ක් වෙන්කර ඇති අතර ඒ යටතේ, නිවාස ව්‍යාපෘති 150 ක් සඳහා අවශ්‍ය පොදු පහසුකම් ලබාදීම අපේක්ෂා කර ඇත. 2018 දෙසැම්බර් මස අවසන් වනවිට රු.මි. 69 ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරමින් නව නිවාසයන් සඳහා ජල ව්‍යාපෘති 47 ක්, ප්‍රවේශ මාර්ග ව්‍යාපෘති 41 ක් හා විදුලි ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කර ඇත. එහි සමස්ථ මූල්‍ය ප්‍රගතිය 99 % කි.

### 6.2.1.7 පොදු පහසුකම් සංවර්ධනය

වැවිලි ප්‍රදේශයන්හි, ඉතා අබලන් තත්ත්වයේ පවතින පඩිපෙළවල් හා කානු පද්ධති සංවර්ධනය කිරීම, ආරක්ෂිත බැමි හා බෝක්කු ඉදි කිරීම, ක්‍රීඩා පහසුකම් සැපයීම හා වැවිලි ප්‍රජාවගේ පොදු ජන ජීවිතය යථාවත් වනු පිණිස අවැසි වෙනත් පහසුකම් විශේෂයෙන් ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන නඟා සිටුවීම, සුභසාධන සංගම් වෙත අවශ්‍ය උපකරණ ලබා දීම යනාදී ව්‍යාපෘති රැසක්මේ යටතේ සිදු කරනු ලබයි.

2018 වර්ෂය තුලදී මේ සඳහා රු.මි.126 ක මුදලක් වෙන් කරන ලදී. 2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වනවිට, වැය කර ඇති මුදල රු.මි. 64ක් වන අතර එහි සමස්ථ මූල්‍ය ප්‍රගතිය 51 % කි. 2015 වසරේ සිට මේ දක්වා මෙම අමාත්‍යාංශය විසින් වැවිලි ප්‍රජාවගේ සුභසාධනය සඳහා මෙවැනි විවිධ ව්‍යාපෘති 1,182 ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා වැයකර ඇති මුළු මුදල රු.මි. 450 ක් පමණ වේ.

## 6.2.2 පසුගාමී ප්‍රදේශ සංවර්ධනය සඳහා 2018 වසරේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය (2018.12.31 දිනට)

| ව්‍යාපෘතියේ ස්වභාවය | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | | වෙන්කල මුදල රු: මි. | 2018 වර්ෂය සඳහා අපේක්ෂිත ඉල්ලක්කය | 2018.12.31 දිනට ක්‍රියාත්මක කල ඒකක සංඛ්‍යාව | 2018.12.31 දිනට වියදම රු: මි. | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැ. මා.ස .හා. | ප්‍රා. ලේ. කා./ප්‍රා සභා | | | | | වැඩ නිමකල | ක්‍රියාත්මක තත්ත්වයේ පවතින |
| වහල නැවත සෙවිලි කිරීම | √ | - | 40 | 1200 | 875 (880+15 ) | 39 | 895 | - |
| ජල සම්පාදනය | √ | √ | 30 | 50 | 51 | 20 | 18 | 33 |
| වැසිකිළි ඉදිකිරීම | √ | √ | 24 | නව 100 සහ අවිච්ඡේද 293 | 293 | 23 | 209 | 84 |
| ළමාසංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවීම | √ | √ | 10 | නව 07 සහ අවිච්ඡේද 19 | 24 | 09 | 13 | 11 |
| වතු රෝහල් මාර්ග සංවර්ධන ව්‍යාපති | √ | - | 200 | වතු රෝහල් මාර්ග 20 හෝ 25 km | 12 | 147 | 7 | 5 |
| ප්‍රවේශ මාර්ග සංවර්ධන ව්‍යාපෘති | √ | √ | | 150 | 275 | | 88 | 187 |
| නව නිවාස සඳහා යටිතල පහසුකම් සංවර්ධනය | √ | - | 70 | නව නිවාස ව්‍යාපෘති 150 ක් සඳහා | 95 | 69 | 95 | - |
| ක්‍රීඩා පිටි/ ආගමික / සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය හා වෙනත් පොදු පහසුකම් සංවර්ධනය | √ | √ | 126 | 150 | 150 | 64 | 57 | 93 |
| එකතුව | | | 500 | | 1,780 | 371 | 1,367 | 413 |

## 6.3 ජීවනෝපාය සංවර්ධනය.

තාක්‍ෂණික ප්‍රවනතාවයත් සමඟ වර්තමානයේ වැවිලි අංශය කිහිප ආකාරයකින් අභියෝගයට ලක්වී ඇත. එයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ වත්මන් පරපුර වැවිලි අංශයේ දැනට පවතින සාම්ප්‍රදායික ක්‍රමවේදයනට අනුගත වීමේදී දක්වන පසුගාමීත්වය, ශ්‍රමයට වැඩි වැටුපක් හා සමාජයේ පිළිගැනීමක් ඇති රැකියාවක් අපේක්‍ෂා කිරීමයි. එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ නිසි නිපුණතාවක් හෝ පුහුණුවක් නොමැතිව තරුණ වැවිලි ප්‍රජාව ක්ෂේත්‍රයෙන් බැහැරව වෙනත් ඉලක්ක සොයා නොපැහැදිලි අනාගතයකට පියමන් කිරීමයි.

එකී තත්ත්වය මග හරවාලමින් වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම සඳහා වැවිලි ක්ෂේත්‍රයට පරිබාහිරව සුදුසු රැකියා ලබා ගැනීමේ අවස්ථා වැඩි කිරීමටත්, ශ්‍රමිකයින් වැවිලි ක්ෂේත්‍රයට ආකර්ෂණය කොට එතුල රඳවා ගැනීම සඳහා සුදුසු පරිසරයක් ඇති කිරීමටත්, වැවිලි ක්ෂේත්‍රය තුල හිඳිමින් අතිරේක ආදායමක් ඉපයීමට ඇති අවස්ථාවන් වැඩි කිරීමටත්, ජාතික ක්‍රියාකාරී සැළැස්ම මගින් වැඩි අවධානයක් යොමු කර ඇති අතර, ඒ සඳහා නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව, ප්‍රජා සවිබල ගැන්වීම (කාන්තාවන් හා තරුණ තරුණියන්) සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණික ඥානය හා පුහුණුව ලබාදීම, උපකරණ හා පහසුකම් ලබාදීම, දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් ඇතුළු සමාජ සවිබල ගැන්වීම් වැඩසටහන් රාශියක් මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ජීවනෝපාය වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය වෙනුවෙන් රු.මි. 100 ක් වෙන් කරන ලද අතර 2018 දෙසැම්බර් මස 31 දින වනවිට ඒ වෙනුවෙන් වැයකර ඇති මුදල රු.මි. 51 කි.

## 6.3.1 2018 වසරේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා එහි ප්‍රගතිය

### 6.3.1.1 ප්‍රජාව දැනුවත් කිරීම

අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානයට පාත්‍රවූද, ජාතික අවශ්‍යතාවක් සේ සලකා ක්‍රියා කරන්නාවූ ද, සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය ඉහල නැංවීම, වකුගඩු රෝග මැඩලීම, මත්ද්‍රව්‍ය නිවාරණය, පරිසර සංරක්‍ෂණය, ජල මූලාශ්‍ර සංරක්‍ෂණය වැනි වැඩසටහන් ක්‍රියාත්මක කොට වැවිලි ප්‍රජාව දැනුවත් කිරීම සඳහා 2015 – 2017 දක්වා රු.මි. 12 ක් පමණ වැයකර ඇති අතර ජනතාවගේ ජීවන මට්ටම හා පෝෂණ තත්ත්වය මෙන්ම, ආකල්ප සංවර්ධනය තුලින් ද ඔවුන් නව මාවතකට යොමු කිරීම මෙමගින් අපේක්‍ෂා කර ඇත.

මේ යටතේ, 2018 වර්ෂයතුලදී දැනුවත් කිරීමේ වැඩසටහන් 1,000 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි. 15 ක් වෙන්කරන ලදී. 2018 දෙසැම්බර් මස අවසන් වනවිට රු: මි. 5.5 ක් වැයකර වැඩසටහන් 553 ක් ක්‍රියාවට නංවා ඇත.

### 6.3.1.2 දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන

සවිමත් ආර්ථික ශක්තියකින් හෙබි අදීන ජාතියක් ගොඩ නංවා "පතිරූප දේශයක් බිහි කිරීම" හා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන වැඩසටහනට සමගාමීව එහි ප්‍රථම අපේක්‍ෂාව වූ දිළිඳුකම ජනතාව තුලින් තුරන් කිරීම උදෙසා අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත වර්ෂ 2030 වනවිට දිළිඳුකමින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව, 2017 වර්ෂය "දිළිඳුකම නිදහස් කිරීමේ වර්ෂය" ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ඉහළම දරිද්‍රතා අගයන් පිළිබිඹු කරනු ලබන වැවිලි ප්‍රජාව ඉලක්ක කොට ස්වයං රැකියා අවස්ථාවන් පුළුල් කිරීමේ හා ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීමේ අරමුණින් කුඩා පරිමාණ ගෙවතු වගාව, නිවාස හා ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ගෙවතු වගාව, මිරිදිය මත්ස්‍ය වගාව හා මුඩු ඉඩම් වගාව ද තරුණ හා කාන්තා ප්‍රජාව බලගැන්වීමේ වැඩසටහන් ද ඇතුළු විවිධ ව්‍යාපෘති 250 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය තුලදී රු.මි. 10 ක් වෙන්කරන ලදී. මේ යටතේ ව්‍යාපෘති 101 ක් ක්‍රියාත්මක කරන ලද අතර මූල්‍ය ප්‍රගතිය රු. මි. 2.5 කි.

### 6.3.1.3 වැවිලි ක්ෂේත්‍රයේ දරුවන් වෙත පෝෂණ අතිරේකයන් ලබාදීමේ වැඩසටහන

ජනාධිපති කාර්යාලයේ මඟ පෙන්වීම යටතේ සෞඛ්‍ය හා **පෝෂණ** ලේකම් කාර්යාලය මගින් සකස් කරන ලද පෝෂණය සඳහා වන බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2017- 2020) මගින් මෙම අමාත්‍යාංශ වෙත පැවරී ඇති කාර්යභාරය අනුව යමින්, ළමා මන්දපෝෂණයේ ඉහළම දත්ත පිළිඹිඹු කෙරෙන වැවිලි ක්ෂේත්‍රයේ දරුවන්ගේ පෝෂණ තත්ත්වය නඟා සිටුවීම සඳහා වන දිර්ඝ කාලීන සැලැස්මක එක් පියවරක් ලෙස වැවිලි ක්ෂේත්‍රයේ අවුරුදු 3 – 5 වයසැති දරුවන් වෙත පෝෂණ අතිරේකයන් ලබා දීමේ වැඩසටහන මෙම අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

“ ටිකිරි ශක්ති ” ලෙසින් නම්කල මෙම අධිපෝෂණීය අමතර ආහාර වේල, අවුරුදු 3 -5 වයසැති දරුවන් 40,000 ක් ඉලක්ක කර ගනිමින් වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල 07 යටතේ පවතින ළමා සංවර්ධන මධ්‍යස්ථාන මගින් දරුවන් වෙත ලබාදීම සිදුකරනු ලබයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදු කරනු ලබන අතර අදාල ප්‍රදේශයන්හි පවුල් සෞඛ්‍ය සේවිකාවන් විසින් හා ළමා සංවර්ධන නිලධාරීන් විසින් අවශ්‍ය මග පෙන්වීම් සිදුකරනු ලබයි.

මෙම “ ටිකිරි ශක්ති ” වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේදී රු. මි. 65 ක් වෙන් කරන ලද අතර 2018 වර්ෂය අවසන් වනවිට ඒ සඳහා රු.මි. 43.5 ක් වැයකොට ඇත.

### 6.3.1.4 වැවිලි ප්‍රජාව පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම

වැවිලි ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙම ක්ෂේත්‍රයේ සෑම අංශයක්ම පිළිබඳව නිසි තොරතුරු තවමත් නොමැතිවීම එම සංවර්ධන කටයුතු නිසිලෙස ක්‍රියාත්මක කිරීමට බාධාවක්ව පවතින බව පෙනී ගොස් ඇත. විවිධ අමාත්‍යාංශයන් විසින් නොයෙකුත් සංවර්ධන වැඩසටහන් වැවිලි ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක කරනු ලැබුවද, එහි ප්‍රතිලාභයන් පිළිබඳ නිසි තොරතුරු නොමැති වීමත්, වැවිලි ප්‍රජාවගේ මූලික තොරතුරු යාවත්කාලීන නොවීමත්, හේතුකොටගෙන වැවිලි ප්‍රජාව පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීමේ කාලීන අවශ්‍යතාවයක් පැන නැගී ඇත.

වැවිලි ප්‍රජාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය උදෙසාම ස්ථාපිත කරන ලද මෙම අමාත්‍යාංශය විසින් මෙම කාලීන අවශ්‍යතාවය හඳුනාගනිමින් ඒ සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු ආරම්භ කරන ලද අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සංනිවේදන ආයතනය (ICTA) මගින් මෘදුකාංගය සකස් කිරීම සඳහා අවශ්‍ය තාක්‍ෂණික මගපෙන්වීම ලබාදේ. ක්ෂේත්‍ර අත්දැකීම් ද උපයෝගී කොට ගනිමින් අදාල තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ප්‍රශ්ණාවලිය දැනටමත් අමාත්‍යාංශය විසින් සකස් කර අවසන් කරන ලද නමුත් වැටුප් සම්බන්ධයෙන් පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් සැළසුම කළ පරිදි වතුවලින් අවශ්‍ය තොරතුරු ලබාගැනීම අපහසුවීම හේතුවෙන් වසර අවසන් වන විට දත්ත සමීක්‍ෂණය සම්පූර්ණ කිරීමට හැකියාවන් නොලැබිණ.

## 6.3.2 2018 වසරේ ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය (2018.12.31 දිනට)

| ව්‍යාපෘතියේ ස්වභාවය | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | | වෙන්කල ප්‍රතිපාදන (රු: මි.) | 2018 වර්ෂය සඳහා අපේක්ෂිත ඉල්කකය | 2018.12.31 ක්‍රියාත්මක කල වැඩසටහන් සංඛ්‍යාව | 2018.12.31 දිනට වියදම රු: මි. | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | වැ. මා. ස. හා. | ප්‍රා.ලේ.කා. /ප්‍රා සභා | | | | | |
| ප්‍රජාව දැනුවත් වැඩසටහන | √ | √ | 15 | වැඩසටහන් 1000 | 553 | 5.5 | 553 (55 %) |
| දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන | √ | √ | 10 | වැඩසටහන් 250 | 101 | 2.5 | 101 (40%) |
| වැවිලි ක්ෂේත්‍රයේ දරුවන් වෙත පෝෂණ අතිරේකයන් ලබා දීමේ වැඩසටහන | √ | - | 65 | දරුවන් 40,000 ක් සඳහා මාස 06 කාලයක් | 40,000 දරුවන් ඉලක්ක කර ගනිමින් මාස 04 ක් ලබාදීම | 43.4 | මාස 04 ක් ක්‍රියාත්මක කරන ලදී. (100 %) |
| වැවිලි ප්‍රජාව පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සංනිවේදන ආයතනය (ICTA), Price watercoop ආයතනයහා සැළසුම් අංශය | | 10 | දත්ත පද්ධතියේ මෘදුකාංගය සකස් කොට අවසන් කිරීම | මෘදුකාංගය සකස් කිරීමේ මූලික කටයුතු අවසන් කිරීම | 0.10 | (35 %) |
| **මුළු එකතුව** | | | **100** | | | **51.5** | |

# 7 තිරසර සංවර්ධන අභිමතාර්ථ ලඟා කර ගැනීම -

## 2018 වසරේ ප්‍රගතිය (2018.12.31 දිනට)

| වැඩසටහන | | තිරසර සංවර්ධන අභිමතාර්ථ | වෙන්කල ප්‍රතිපාදන ( රු.මි. ) | වියදම ( රු.මි. ) |
|---|---|---|---|---|
| 1 කඳුරට නව ගම්මාන සඳහා නිවාස ලබාදීම | 11.1 | 2030 වනවිට සියළු දෙනාටම ප්‍රමාණවත්, ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩි දියුණු කිරීම තහවුරු කිරීම | **2,090 (11+17)** | **1,240 (11+17)** |
| | 1.5.1 | වසර 2030 වනවිට දුප්පත් හා අවදානම් ජන කොටස් වලට සිදුවන හානිකර සමාජ, ආර්ථික හා පාරිසරික බලපෑම් අවම කිරීම | **587 (13)** | **932 (13)** |
| | 1.4 | වසර 2030 වනවිට සියළු ස්ත්‍රී පුරුෂ, දුප්පත් හා අවදානම් ජන කොටස් ආර්ථික සම්පත්, ඉඩම් අයිතිය හා මූලික පහසුකම් සඳහා සමාන අයිතිවාසිකම් ලැබීම තහවුරු වීම | | |
| 2. යසුගාමී ප්‍රදේශබල සමාජ ආර්ථික සංවර්ධනය | 6.1 | වසර 2030 වනවිට සියළු දෙනාටම ප්‍රසස්ථ මට්ටම් යටතේ පානීය ජලය ලබාගැනීමට සමාන අවස්ථා තහවුරු කිරීම. | **500** | **370** |
| | 6.2 | වසර 2030 වනවිට ප්‍රමාණවත් සනීපාරක්ෂාවක් හා ස්වස්ථතාවක් ලැබීමේ අවස්ථා සියළු දෙනාටම අත්පත්කර ගැනීම | | |
| | 4.2 | වසර 2030 වන විට සියළු ගැහැණු හා පිරිමි ළමයින් සඳහා ගුණාත්මක මට්ටමේ පූර්ව ළමා විය සංවර්ධනයක් සඳහා ප්‍රවේශය ලැබීම | | |
| | 11.2 | වසර 2030 වන විට ආරක්ෂිත, තිරසර ප්‍රවාහන පද්ධති සඳහා වූ ප්‍රවේශය සියලු දෙනාටම ලබාදීම,මාර්ග ආරක්ෂාව වැඩි දියුණු කිරීම හා ප්‍රවාහන සේවා දියුණු කිරීම | | |
| | 7.1.1 | විදුලිබලය ලබාගැනීමට ඇති ප්‍රවේශය තහවුරු කිරීම | | |
| 3. ජීවනෝපාය සංවර්ධනය | 1.2 | වසර 2030 වනවිට රටක පවතින ජාතික නිර්ණායකයන්ට අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගේ ප්‍රමාණය අවම වශයෙන් අඩකින්වත් අඩු කිරීම | **115 (17)** | **53 (17)** |
| | 2.2 | 2030 වර්ෂය වනවිට විවිධ මන්ද පෝෂණ තත්ත්ව අවසන් කිරීම හා වසර 5 ට අඩු දරුවන් ගේ වයසට සරිලන උසක් නොමැති වීම හා උසට සරිලන බරක් නොමැතිවීම පිළිබඳ ඉලක්කවලට 2025 දි ළඟාවීම. | | |
| | 4.3 | 2030 වන විට සියළු ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා ප්‍රමාණවත් හා ගුණාත්මක වූ තාක්ෂණික,වෘත්තීය හා තෘතියික අධ්‍යාපනයක් (විශ්ව විද්‍යාලද ඇතුළු ) සඳහා සමාන ප්‍රවේශයක් ලැබීම තහවුරු කිරීම. | **94 (13)** | **- (13)** |
| | 4.5 | වසර 2030 වන විට අධ්‍යාපනය, වෘත්තීය පුහුණු යනාදිය සඳහා වූ ස්ත්‍රී පුරුෂ අසමානතාවන් ඉවත් කර සැමට අධ්‍යාපන අවස්ථා ලබාදීම. | | |
| | 8.6 | වසර 2030 වන විට රැකියාවක,අධ්‍යාපනයේ හෝ පුහුණුවක යෙදී නොසිටින තරුණ පිරිසේ ප්‍රමාණය සැළකිය යුතු තරම් අඩු කිරීම. | | |
| | | **එකතුව** | **3,386** | **2,595** |

# 8 අමාත්‍යාංශය විසින් 2018 වසරේ අත්පත් කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණ

## 8.1 නව නිවාස 10,000 ක් ඉදි කිරීම සඳහා ඉන්දියානු රජය සමඟ ගිවිසුමකට එළඹීම

ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2017 වර්ෂයේ මැයි මසදී සිදුකල ශ්‍රී ලංකා සංචාරය තුලදි වැවිලි ප්‍රජාව වෙත දුන් පොරොන්දුවක් ඉටු කරමින් ඉන්දීය රජයේ පූර්ණ ආධාර යටතේ නව නිවාස ඒකක 10,000 ක් වැවිලි ප්‍රජාව වෙත හිමි කරදීම සඳහා 2018.08.12 දින ඉන්දීය රජය සමඟ ගිවිසුමකට එළඹීම.

## 8.2 " නව ගම්මාන සංවර්ධන අධිකාරිය " පිහිටුවීමට අදාල පනත සම්මත කර ගැනීම

මෙම අමාත්‍යාංශයේ මූලික අරමුණක් වූ වැවිලි ප්‍රජාව සඳහා " නව ගම්මාන "පිහිටුවීමේ සංකල්පය ක්‍රියාවට නැංවීමේ මූලික අභිලාෂය පෙරදැරිව, දැනට ක්‍රියාත්මක වන සංවර්ධන කටයුතු කඩිනම් කිරීමේ අරමුණින්, 2018.06.25 වන දින "වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය" පිහිටුවීමට අදාල, 2018 අංක 32 දරණ පාර්ලිමේන්තු පනත සම්මත කර ගැනීම.

# 9 අමාත්‍යාංශය විෂයය පථයට අයත් ආයතන

## 9.1 වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

මෙම අමාත්‍යාංශයේ මූලික අරමුණක් වූ “ නව ගම්මාන සංකල්පය ” ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන අභිලාෂය පෙරදැරිව, දැනට ක්‍රියාත්මක වන සංවර්ධන කටයුතු කඩිනමින් ඉටු කිරීමේ අරමුණින් 2018.06.25 වන දින, “**වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය**” පිහිටුවීමට අදාල 2018 අංක 32 දරණ පනත, පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදී. එම පනතට අනුව,

### 9.1.1 අධිකාරියේ අරමුණු

1. වැවිලි කලාපයේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා යටිතලපහසුකම් සංවර්ධනය තුලින් හඳුනාගත් ප්‍රදේශවල වැවිලි ප්‍රජාව ප්‍රධාන සමාජ ධාරාවට ඇතුළත් කිරීම සහතික කිරීම
2. හඳුනාගත් ප්‍රදේශවල වැවිලිප්‍රජාව, ඔවුන ටජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි වන පරිදි සමාජමය හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම.

### 9.1.2 අධිකාරියේ ක්‍රියාකාරකම්

1. වැවිලි ප්‍රදේශවල නව ගම්මාන සංවර්ධනය කිරීම සඳහා රජයේ සැළසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
2. අධිකාරියේ අරමුණු ඉටුකරගැනීම සඳහා වැවිලි කලාපයේ අනෙකුත් ජාතික, දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය  මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
3. නව ගම්මාන සංවර්ධනය සඳහා වූ රජයේ සැළසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී වැවිලි කලාපයේ ප්‍රජාමූල සංවිධානවල සහභාගිත්වය සහතික කිරීම.
4. වැවිලි ප්‍රදේශයන්හි ඇති නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා හිමිකම් ඔප්පු නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
5. වැවිලි ප්‍රදේශයන්හි වෙසෙන තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා තෘතීයික හා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම සඳහා සහාය සැලසීම.
6. වැවිලි ප්‍රජාවට අත්‍යවශ්‍ය සේවා සැපයීම පහසු කරලීම සඳහා පළාත් සභා අමාත්‍යාංශ හා  අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශවල ප්‍රාදේශීය මට්ටමේ කාර්යාල සමග කටයුතු කිරීම.
7. වතු ප්‍රජාව සඳහා විකල්ප ජීවනෝපාය අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ඒසම්බන්ධයෙන්  අවශ්‍ය මග පෙන්වීම හා යෙදවුම් සැපයීම.
8. තමජීවනෝපාය මාර්ග නගාසිටුවී මසඳ භාකාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ද ඇතුළු වතු අංශයේ විවිධ ප්‍රජා කණ්ඩායම් සවි බල ගැන්වීම.

9. වැව්ලි ප්‍රදේශයන්හි පිහිටි නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ගෙන් පැවතෙන්නන්ට ද එම නීත්‍යානුකූල පදිංචිකරුවන් විසින් භුක්ති විඳිනු ලබන සියලු පහසුකම් සලසනු ලබන බවට තහවුරු කිරීම

10. වැව්ලි ප්‍රදේශයන්හි භූමි සහ ජල මූලාශ්‍රවල භෞතික තත්ත්වය පහත වැටීම් අවම කිරීමේ සහ පරිසර දූෂණය තුරන් කිරීමේ ද අරමුණින් නිවාරක සහ ප්‍රතිකර්මීය යන දෙයාකාරයෙන්ම වූ සංරක්ෂණ පියවර ශක්තිමත් කිරීම.

11. ජාතික ගොඩනැගිලි පර්යේෂණ මධ්‍යස්ථානය හා අපදා කළමනාකරණ මධ්‍යස්ථානය විමසා හඳුනාගත් ප්‍රදේශවල උවදුරු සහිත ප්‍රදේශ හඳුනාගැනීම සහ නේවාසික කාර්ය සඳහා නීති විරෝධී ලෙස පදිංචිවීම්වලින් ආරක්ෂා කරගනිමින් ඒවා විකල්ප ඵලදායී භාවිතයට යොදා ගැනීම.

12. වැව්ලි ප්‍රදේශවල ප්‍රමාණවත් සමාජ සේවා පහසුකම් හා සහ තිරසාර යටිතල පහසුකම් සැලසීම ප්‍රවර්ධනය

## 9.1.3 අධිකාරියේ කළමනාකරණය

වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ කළමනාකරණය සඳහා නිල බලයෙන් පත්වන සාමාජිකයින් සංඛ්‍යාව 07 කි.

1. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්

2. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන නිලධරයෙක්

3. වැව්ලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්

4. පොදු ව්‍යාවසාය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්

5. පළාත් සභා සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්

6. නිවාස හා ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්

7. ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්

එයට අමතරව, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය, මූල්‍ය හා පළාත් පරිපාලනය යන අංශයන්හි ප්‍රවීණතාවක් දක්වන පුද්ගලයන් අතුරින් පත්කරනු ලබන සාමාජිකයන් හය දෙනෙකුද මෙම

කළමනාකරණ මණ්ඩලයට එක්වේ. මින් එක් සාමාජිකයෙකු වැව්ලි සමාගම් නියෝජනය කිරීම සඳහා ලංකා වැව්ලිකරුවන්ගේ සංගමයෙන් පත්කරනු ලැබිය යුතුය. අධිකාරියේ සභාපති හා උප සභාපති වන්නේද අමාත්‍යවරයා විසින් පත්කල සාමාජිකයින් අතුරින් දෙදෙනෙකි.

"අධ්‍යක්ෂ ජනරාල්" අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර ඔහු, විෂය භාර අමාත්‍යාවරයා විසින් පාලක මණ්ඩලයේ නිර්දේශය මත පත් කරනු ලබයි.අධ්‍යක්ෂ ජනරාල් විසින් කාර්ය මණ්ඩලයේ පරිපාලනය අතුළුව අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම භාරව කටයුතු කලයුතු අතර මණ්ඩලයේ සියළු තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද වගකිව යුතුය. එමෙන්ම මණ්ඩලය විසින් ඔහුට පවරන සියළු කර්තව්‍යයන් ඉටු කිරීමට බැඳී සිටින අතර මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන්ද ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන්ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු කලයුතුය.

## 9.1.4 අධිකාරියේ මූල්‍ය කටයුතු

අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු අතර මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේය. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියල කළයුතු අතර රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතුය.

සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වීමෙන් සය මසක් ඇතුලත විගණනය කරන ලද ගිණුම් හා විගණකාධිපතිගේ වාර්තාව ද, ඉදිරි වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාව ද ඇතුලත්ව සකස් කරන ලද වාර්ෂික වාර්තාව විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කල යුතුය. අමාත්‍යවරයා විසින් එම වාර්තාව ලැබුන දින සිට සය මසක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

## 9.2 වැවිලි මානව සංවර්ධන භාරය

### 9.2.1 පසුබිම

"වැවිලි මානව සංවර්ධන භාරය", වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා, 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ, "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය" නමින් 1992 සැප්තැම්බර් මස 18 වන දින ස්ථාපිත කරන ලද සමාගමකි.

1992 දී රජය ගත් ප්‍රතිපත්තිමය තීරණයකට අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අයත් වතු පවරාගෙන එම වතුවල කළමණාකාරීත්වය ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක්

ඔක්තෝම්බර් මස 25 වන දින, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ සමාජ අංශ ඒකාබද්ධ කරමින් වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ සෞඛ්‍ය සහ අනෙකුත් සමාජ සුභ සාධන කටයුතු මෙන්ම ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම උදෙසා "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය", "වැවිලි මානව සංවර්ධන භාරය" ලෙස ප්‍රතිනාම ගත කරන ලදී. මේ වන විට මෙම භාරය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත.

යථෝක්ත ඉලක්ක සාක්ෂාත් කරගනු පිණිස වැවිලි මානව සංවර්ධන භාරය මගින් පහත දැක්වෙන කටයුතු ක්‍රියාත්මක කරයි.

- වතු ප්‍රජාවේ පේළි නිවාස වෙනුවට ස්වයං අයිතිය සතු තනි නිවාස සුදුසු පුද්ගලයන් වෙත ලබාදීම.
- පැරණි පේළි නිවාස අලුත්වැඩියා කිරීම හා ඒවායේ වහලවල් නැවත සෙවිලි කිරීම(re-roofing).
- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා සුදුසුකම් ලත් ළමා සංවර්ධන නිලධාරීන් හඳුන්වා දීම.
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ( මාර්ග / ගොඩනැගිලි / ආගමික මධ්‍යස්ථාන යනාදිය)
- සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා සමාජ සංවර්ධන කටයුතු
- අලෙවි පහසුකම් සලසා දීම
- ජීවනෝපාය මාර්ග සඳහා පහසුකම් සළසා දීම

### 9.2.2 සංවිධාන ව්‍යුහය හා සම්බන්ධිත ආයතන

"වැවිලි මානව සංවර්ධන භාරය", කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් කරන ලද ආයතනයකි. මෙය වැවිලි අංශයේ දස ලක්ෂයකට අධික ජනතාවකගේ ජීවන තත්ත්වය නගාසිටුවීම පිණිස වැඩසටහන් සම්බන්ධීකරණය කරමින්, ඊට අවශ්‍ය පහසුකම් සලසාදීම උදෙසා ක්‍රියාකරන, ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වතු අංශයේ වෘත්තීය සමිතිවලින් සමන්විත ත්‍රෛපාර්ශ්වික ආයතනයකි.

මෙය වතු කම්කරුවන්ගේ යහපත උදෙසා පිහිටුවා ඇති මෙම ආයතනය, යටිතල පහසුකම් හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහිලා රජයේ අදාළ අමාත්‍යාංශ, වෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකු සහ ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියාත්මක වේ. මෙහි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල, රොබට් ගුණවර්ධන මාවතේ පිහිටා ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ මෙහෙයවීම යටතේ පවත්වාගෙන යනු ලැබේ. ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් සහ නුවරඑළිය යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල හතක් මගින් ප්‍රධාන කාර්යාලයේ කටයුතු ශක්තිමත් කෙරේ. ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයා අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධානියා වන අතර, තාක්ෂණික මූල්‍ය හා කළමනාකරණ කාර්ය මණ්ඩලය ඔහුට සහාය සලසයි.

## 9.2.3 වැවිලිමානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය ව්‍යූහය



## 9.2.4 සම්බන්ධිත ආයතන - වතු සේවක නිවාස සමූපකාර සමිතිය

වතු සේවක නිවාස සමූපකාර සමිති, සමූපකාර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව 1993 වසරේදී පිහිටුවන ලදී. මූලික වශයෙන් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මෙම සමිති, මේ වනවිට ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන වතුයායවල් 435 ක් ආශ්‍රිතව ක්‍රියාත්මක වේ.මෙම සමූපකාර සමිති බොහොමයක්, ප්‍රමුඛ ප්‍රජා මූල සංවිධාන ලෙස රට තුළ ස්ථාපනය වී ඇත. ඒවා වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල වල අධීක්ෂණය යටතේ නිර්ණායක මත පදනම් වූ ඉහළ ශ්‍රේණිගත කිරීම් වලට ලක් කර ඇති අතර, ඒවා නිරන්තර සුපරික්ෂාවට භාජනය වේ.

"හරිත රන් නිවාස"ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක ප්‍රතිලාභී මූලික නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රමුඛතම කාර්යභාරයක් මෙම සමිති මගින් ඉටු කරනු ලබයි. එමෙන්ම වතු සේවක නිවාස සමූපකාර සමිති" (වනිස) බැංකුව" යන නමින් ඔවුන්ගේම බැංකු හරහා සිය අරමුදල් උපදවාගනු ලබන අතර, ණය මුදල් සපයා දීමට ද කටයුතු කරයි.

ණය සැපයීමට අමතරව, රැකියා අවස්ථා ද උදා කරමින්, වතුවල පදිංචි නිවැසියන් හට ඔවුන්ගේ සේවා අවශ්‍යතා සඳහා පහසු ප්‍රවේශයක් සලසා දෙමින්, සමූපකාර සමිති, සිල්ලර භාණ්ඩ / ගෘහසාධන වෙළඳසැල්, බාබර් සැලුන් හා සන්නිවේදන මධ්‍යස්ථාන යනාදී ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමටද පහසුකම් සලසා ඇත. වතු නිවැසියන්ගේ ජීවන තත්ත්වය, ඔවුන්ගේ සෞඛ්‍ය, පෝෂණය, සනීපාරක්ෂාව හා පවිත්‍රතාව යනාදිය ඉහළ නැංවීම පිණිස ඔවුනට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා පහසුවෙන් ඔවුන් වෙත ළඟාකර දීම සඳහා, වතු සේවක නිවාස සමූපකාර සමිති තම උප නියෝජිතයන් ලෙස යොදාගනිමින් "වැවිලි මානව සංවර්ධන භාරය", බහු ජාතික සමාගම් සහ වෙනත් ප්‍රමුඛ පෞද්ගලික අංශයේ සංවිධාන සමග ද ඒකාබද්ධව කටයුතු කරයි.

## 9.2.5 වැවිලි මානව සංවර්ධන භාරය මගින් මෙම අමාත්‍යාංශ ප්‍රතිපාදනමත ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් / ව්‍යාපෘති

මෙරට ආර්ථිකය නගා සිටුවීමට සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික අංශයන්ගේ උන්නතිය සඳහා වැවිලි ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය වැදගත් අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. මෙම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය නායකත්වය ගෙන ක්‍රියා කරන අතර, එහි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානම හවුල්කාර පාර්ශ්වය ලෙසට වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියා කරනු ලබයි.

ඒ අනුව අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය සඳහා වැවිලි ප්‍රජාව ඉලක්ක කොට නව නිවාස ඒකක 1,566ක් ඉදිකිරීම සඳහා ද අවිච්ඡේදව පැවැති නිවාස 2,567 ක ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහාද වැවිලි මානව සංවර්ධන භාරය වෙතප්‍රතිපාදන වෙන් කර ඇත.මෙම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එක් නිවසක් සඳහා 6% ක පරිපාලන දීමනාවක් අමාත්‍යාංශය විසින් ගෙවනු ලැබේ.

මීට අමතරව, පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතින් ක්‍රියාවට නැංවීම සඳහා ද, වැඩි දායකත්වයක් දරනු ලබන්නේ වැවිලි මානව සංවර්ධන භාරයයි. එමෙන්ම, ළමා මන්දපෝෂණය අවම කිරීම සඳහා අමාත්‍යාංශය විසින් හඳුන්වා දුන් "ටිකිරි ශක්ති" පෝෂණ වැඩසටහන ද වැවිලි මානව සංවර්ධන භාරයේ අධීක්ෂණය යටතේ වතු ළමා සංවර්ධන මධ්‍යස්ථාන හරහා, ක්‍රියාත්මක කරනු ලබයි.

තවද, ජාතික අවශ්‍යතාවයක් හඳුනාගෙන ඇති දිළිඳුකම තුරන් කිරීම, සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය ඉහල නැංවීම, වකුගඩු රෝග මැඩලීම, මත්ද්‍රව්‍ය නිවාරණය, පරිසර සංරක්ෂණය, ජල මූලාශ්‍ර සංරක්ෂණය වැනි අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබනවිශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ද වැවිලි මානව සංවර්ධන භාරය සුවිශාල දායකත්වයක් සලසනු ලබයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 4% පරිපාලන දීමනාවක් අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවනු ලබයි.

## 9.2.6 වැවිලි මානව සංවර්ධන භාරය මගින් අනෙකුත් ආයතනයන්හි ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන වැඩසටහන් / ව්‍යාපෘති

### 9.2.6.1 පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

ලෝක බැංකුආධාර යටතේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා එක්ව පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා වන පස් අවුරුදු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, එහි සමස්ත ආයෝජනය ඇ.ඩො.මි.10 ක් වේ. වැවිලි ප්‍රදේශවල ජීවත්වන වයස අවුරුදු 3–5 අතර දරු දැරියන්ගේ ළමා සංවර්ධන කටයුතු ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වන අතර, මෙය වසර 2020 දී නිම කිරීමට නියමිතය. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රමවේද දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

1. භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම
2. මානව සම්පත් සංවර්ධනය

භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ ගොඩනැගිලි, ක්‍රීඩා පිටි සහ උපකරණද සහිතව ඉදිකිරීමට අපේක්ෂිත නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 140 ක් වන අතර, දැනටමත් වැවිලි ප්‍රදේශ තුල ඇති වැඩිදියුණු කිරීමට නියමිත ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 175 කි. එමෙන්ම අවශ්‍ය උපකරණ ද සහිතව නව ක්‍රීඩා පිටි 175 ක් ඉදි වන අතර දැනට ඉදි කර ඇති ක්‍රීඩා පිටි 210 ක් නවීකරණකය කිරීම ද සිදු කෙරේ.

මෙම ව්‍යාපෘති යයටතේ, 2016 - 2018 වර්ෂයදක්වා වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල හත මගින්, නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන 84ක් ඉදිකිරීමට හා පවතින ළමා සංවර්ධන මධ්‍යස්ථාන 105 ක් වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූලික කටයුතු අරඹා ඇති අතර,ක්‍රීඩාපිටි 105 ක් ඉදිකිරීමටත් තවත් ක්‍රීඩාපිටි 84 ක් වැඩි දියුණු කිරීමටත් අවශය කටයුතු සිදු කරනු ලබයි.

## 9.2.6.1.1 භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල භෞතික ප්‍රගතිය

| ප්‍රාදේශීය කාර්යාලය | නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම | | ළමා සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම | | නව ක්‍රීඩා පිටි ඉදි කිරීම | | ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම | |
|---|---|---|---|---|---|---|---|---|
| | නිමකල | ක්‍රියාත්මක තත්ත්වයේ පවතින | නිමකල | ක්‍රියාත්මක තත්ත්වයේ පවතින | නිමකල | ක්‍රියාත්මක තත්ත්වයේ පවතින | නිමකල | ක්‍රියාත්මක තත්ත්වයේ පවතින |
| **2018 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති** | | | | | | | | |
| ගාල්ල | - | - | 5 | - | 5 | - | 6 | - |
| බදුල්ල | 2 | - | 5 | | 5 | - | 6 | - |
| හැටන් | 1 | 5 | 5 | - | 5 | - | 6 | - |
| මහනුවර | - | 2 | 4 | 1 | 5 | - | 6 | - |
| කෑගල්ල | - | 4 | 5 | - | 5 | - | 6 | - |
| නුවරඑළිය | - | - | 5 | - | 5 | - | 6 | - |
| රත්නපුර | - | 3 | 5 | - | 5 | - | 6 | - |
| | | | | - | | | | |
| **එකතුව** | **03** | **14** | **34** | **01** | **35** | **-** | **42** | **-** |
| | | | | | | | | |
| **2018 වර්ෂයේ නව ව්‍යාපෘති** | | | | | | | | |
| ගාල්ල | - | - | 5 | 4 | 5 | - | 6 | - |
| බදුල්ල | - | - | 3 | - | 5 | - | 6 | - |
| හැටන් | - | - | 3 | - | 6 | - | 6 | - |
| මහනුවර | - | - | 2 | 1 | 3 | 2 | 5 | - |
| කෑගල්ල | - | - | 3 | - | 5 | - | 6 | - |
| නුවරඑළිය | - | - | 3 | - | 4 | - | 7 | - |
| රත්නපුර | - | - | 3 | 7 | 5 | - | 5 | - |
| | | | | | | | | |
| **එකතුව** | **-** | **-** | **22** | **12** | **33** | **02** | **41** | **-** |

